පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 77

ආයතනයේ නම : කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය.

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 77

நிறுவணத்தின் பெயர் : தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு- இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்பு பணியகம்.

பாராளுமன்றத்தின் அரச கணக்கு குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119 (4)இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No: 77

Name of the institution: Ministry of Labor and Foreign Employment - Sri Lanka Bureau of Foreign Employment

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No.119(4).

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 77

ආයතනයේ නම : කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය.

විමර්ශනය කරන ලද දිනය - 2022 ඔක්තෝබර් 21

කාරණා අංකය	කමිටුව හඳුනා ගන්නා ලද අඩුපාඩු	හඳුනා ගන්නා ලද අඩුපාඩු නිවැරදි කිරීම සඳහා කාර්යාංශය හා අමාත්‍යාංශය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග/ වර්තමාන තත්ත්වය
1	**ගුණාත්මක භාවයෙන් යුතු පුහුණු ශ්‍රමිකයින් විදෙස්ගත කිරීම සඳහා වන ඒකාබද්ධ යාන්ත්‍රණය** ගුණාත්මක භාවයෙන් යුතු පුහුණු ශ්‍රමිකයින් විදෙස්ගත කිරීම සඳහා විදේශ රැකියා ක්ෂේත්‍රයට අදාළ ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් මෙන්ම ඒ හා සම්බන්ධ විවිධ වූ ආයතන වන විදේශ අමාත්‍යාංශය, විදේශ දූත මණ්ඩල, වෘත්තිය හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති වෘත්තිය පුහුණු ආයතන, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව හා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තම විෂය පථයට අදාළව සකස් කරන ලද ජාතික ප්‍රතිපත්තීන් හා සැළසුම්වල ඇතුළත් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ඒකාබද්ධ යාන්ත්‍රණය. **කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග** මේ පිළිබඳ ඒකාබද්ධ යාන්ත්‍රණයක් රට තුළ ක්‍රියාත්මක වී නොතිබුණු බව අනාවරණය විය. එමෙන්ම, ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අදාළ ක්‍රියාකාරී සැලැස්මට අනුව 2020 වර්ෂයේදී එක් උපදේශන කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. 2021 හා 2022 වර්ෂයන්හි දී කිසිදු රැස්වීමක් පවත්වා නොතිබුණු බව ද සඳහන් විය.	අදාළ අමාත්‍යාංශ නියෝජනය කරමින් අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් නම් කරන ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් කමිටුව විවිධ අවස්ථා වලදී රැස්වූ අතර තරහකාරී විදෙස් රැකියා වෙළෙඳපොල වෙත ගුණාත්මක භාවයෙන් හා නිපුණතාවයෙන් යුතු ශ්‍රම බලකායක් සැපයීම පරමාර්ථ කර ගනිමින් සකස් කරන ලද කඩිනම් ක්‍රියාකාරී සැලැස්ම 2023.01.18 දින රාජ්‍ය ගිණුම් කාරක සභාවේ අනු කමිටුව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2023.01.18 දින රැස් වූ අනුකමිටුවේ නියෝග අනුව විදෙස් රැකියා වෙළඳපළ වෙත ගුණාත්මකභාවයෙන් සහ නිපුණතාවයෙන් යුතු ශ්‍රම බලකායක් සැපයීම අරමුණු කරගනිමින් සකස් කරන ලද කඩිනම් ක්‍රියාකාරී සැලැස්ම 2023.03.01 දින රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. **(ඇමුණුම 01)** ඒ අනුව සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව 2023.06.15 දිනට වූ ප්‍රගතිය මේ සමඟ ඉදිරිපත් කරමි. **(ඇමුණුම 2)**

	2020 වර්ෂයේදී පැවැත් වූ රැස්වීම් නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසුවිපරමක් සිදු වී නොතිබුණි. යෝජිත පරිදි අන්තර් අමාත්‍යාංශ කමිටුවක් පිහිටුවා නොතිබුණු බව ද මෙහිදී අනාවරණය විය. විදේශ රැකියා අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා වෘත්තිය පුහුණු අමාත්‍යාංශය ඒකාබද්ධව ගුණාත්මක පුහුණු ශ්‍රමිකයින් රැකියා වෙළෙඳපලට යොමු කිරීමේ දීර්ඝකාලීන වැඩපිළිවෙලට අනුව ඇති කර ගත් ගිවිසුම් වල මේ දක්වා ප්‍රගති සමාලෝචනයක් සිදු නොකිරීම පිළිබඳව ද කාරක සභාවේ අප්‍රසාදය පළ විය.	
	ජාතික විගමණික ශ්‍රමික ප්‍රතිපත්තියක් සකස් කර තිබුණද එම ප්‍රතිපත්තිය පදනම් කර ගෙන කටයුතු ක්‍රියාත්මක නොවීම කාරක සභාවේ අවධානයට යොමු විය. මෙම ප්‍රතිපත්තිය කාලීනව සංශෝධනයට ලක් කර අමාත්‍ය මණ්ඩලයට යොමු කර අදාළ නිර්දේශ වැඩිදුර සංශෝධන සඳහා කටයුතු සිදු කරමින් පවතින බව ද ප්‍ර.ග.නි. (ප්‍රධාන ගනන් දීමේ නිලධාරි) ප්‍රකාශ කළේය. ගුණාත්මක භාවයෙන් යුතු ශ්‍රමිකයන් විදේශගත කිරීම සඳහා අදාළ වන අනෙකුත් සම්බන්ධිත ආයතන ද (විදේශ කටයුතු අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, වෘත්තිය පුහුණු අධිකාරිය, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව) මෙම කාරක සභාව හමුවට කැඳවීමට කාරක සභාව තීරණය කළේය.	විගමනය පිළිබඳ ජාතික විගමනික ශ්‍රමික ප්‍රතිපත්තියේ සඳහන් මූලික ප්‍රතිපත්ති ක්ෂේත්‍ර 04 ට (Core Policy Area) සමගාමීව කාර්යාංශයේ 2023 ක්‍රියාකාරී සැලැස්මේ Trust Area 04 යටතේ ක්‍රියාකාරකම් පෙළගස්වා ඇත. සෑම කාර්තුවක් අවසානයේම ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වමින්, කාර්යාංශ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම්, ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අධීක්ෂණය කෙරේ. මේ ආකාරයෙන්ම, කාර්යාංශයේ 2024 ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ කටයුතුද මේවන විට ආරම්භ කර ඇත.

	නිර්දේශ/ නියෝග විගමණික ශ්‍රමික ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම හා එය ක්‍රියාත්මක කිරීමේ කටයුතු කඩිනම් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ ග.නි. වෙත නියෝග කළේය.	"රැකියා සඳහා විගමණය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම 2023 – 2027 යන මැයෙන්" කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා ඉදිරිපත් කළ 2023.07.31 දිනැති සංදේශය සඳහා 2023 සැප්තැම්බර් 04 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත.
2	**විදේශ රැකියා අවස්ථා ප්‍රවර්ධනය සඳහා ශ්‍රමික ඉල්ලුම හා ශ්‍රමික අවශ්‍යතා ඇති නව අංශ හඳුනා ගැනීම.** මේ සඳහා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් නිසි යාන්ත්‍රණයක් සකස් කර නොතිබුණු බව මෙහිදී අනාවරණය විය. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත අනුව විදේශ සේවා නියුක්ති අවස්ථා පිළිබඳ පර්යේෂණ කටයුතු සඳහා එම කාර්යාංශයේ පර්යේෂණ අංශය විසින් 2020 වර්ෂයේ සිට මේ දක්වා පර්යේෂණ 09 ක් සිදු කර ඉන් 04 ක වැඩ අවසන් කර තිබුණද ඉහත අරමුණ ඉටුවන පරිදි එම පර්යේෂණ සිදු කර නොතිබුණු බව මෙහිදී අනාවරණය විය. පර්යේෂණ කටයුතුවල ප්‍රතිඵලයක් ලෙස විගමණික ශ්‍රමිකයන්ට දායකත්ව විශ්‍රාම වැටුපක් හඳුන්වා දී ඇති බව ද, මැදපෙරදිග ශ්‍රමිකයන් සඳහා සේවා යෝජකයා විසින් දැරිය යුතු රක්ෂණ ක්‍රමයක් ආරම්භ කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමට කටයුතු කර ඇති බවද ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. වෙනස් වන විදෙස් රැකියා වෙළෙඳපළ ඉල්ලුම් පිළිබඳ පර්යේෂණ සිදු කර රජය දැනුවත් කර ක්‍රියාකාරී සැලැස්මක් සකස් නොකිරීම ද,	මෙහි සඳහන් පරිදි **පහත** සඳහන් පර්යේෂණ අධ්‍යයන 9 යේ කටයුතු මේ වන විට අවසන් කර ඇත. 1.ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින් විදේශ රැකියාවලට බඳවාගැනීමේ දී අය කෙරෙන ගාස්තු හෝ පිරිවැය පිළිබඳ අධ්‍යයනය. 2.සංක්‍රමණික සේවක පවුල්වල ඉතුරුම් හැසිරීම් මත ශ්‍රම සංක්‍රමණයේ බලපෑම පිළිබඳ අධ්‍යයනය. 3.රැකියා සඳහා විදේශගතවන කාන්තාවන් විසින් "පවුල් පසුබිම් වාර්තාව" ලබාදීමේ ප්‍රතිපත්තියෙහි සාර්ථකත්වය අධ්‍යයනය. 4.ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ආපසු පැමිණි සංක්‍රමණික සේවකයින් වෙනුවෙන් ක්‍රියාත්මක කෙරෙන ස්වයං රැකියා සඳහා ආධාර ලබාදීමේ වැඩසටහනෙහි ඵලදායිතාවය පිළිබඳව අධ්‍යයනය. 5 . ශ්‍රී ලාංකිකයින් බහුලව සේවය කරන රාජ්‍යයන්හි දැනට ක්‍රියාත්මක වන හදිසි අනතුරු හෝ රක්ෂණ වන්දි වැඩසටහන්වල අඩුපාඩු හඳුනාගෙන විසඳුම් යෝජනා කිරීම සඳහා වූ අධ්‍යයනය. 6. කොවිඩ් වසංගතය හේතුවෙන් ආපසු පැමිණි විගමණික සේවකයින්ගේ සමාජ ආර්ථික ගැටළු හඳුනාගැනීම සහ විසඳුම් යෝජනා කිරීම පිළිබඳව අධ්‍යයනය. 7. එක් එක් රටවල සංක්‍රමණික සේවකයින් සඳහා කොවිඩ් හි බලපෑම පිළිබඳ විශේෂිත වාර්තා 8. ගෘහස්ථ ක්ෂේත්‍රයේ කාන්තා රැකියා ඇණවුම් සහ වෙනත් රැකියා කාණ්ඩ සඳහා වන රැකියා ඇණවුම් අතර සහසම්බන්ධතාව පිළිබඳව අධ්‍යයනය . 9. විගමණික ශ්‍රමිකයින්ගේ දූ දරුවන්ට ලබාදෙන ශිෂ්‍යත්ව වැඩසටහන පිළිබඳ අධ්‍යයනය.

	රජයන් අතර ඇති කරගත් ගිවිසුම් අනුව රැකියා අවස්ථා සඳහා ප්‍රමාණවත් ලෙස පුහුණු ශ්‍රමිකයන් විදේශ රැකියා සඳහා යොමු නොකිරීම ද කාරක සභාව නිරීක්ෂණය කළ අතර ඒ පිළිබඳව සිය අප්‍රසාදය පළ කළේය.	ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් බඳවා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය හා ඊශ්‍රායලය අතරත් කොරියානු ජනරජය අතරත් අවබෝධතා ගිවිසුම් දෙකක් වෙන් වෙන් වශයෙන් අත්සන් කර ඇත. **(අ) ඊශ්‍රායලය සමඟ අත්සන් කර ඇති ගිවිසුමේ ප්‍රගතිය** 2017 වසරේ නියමු ව්‍යාපෘතියක් ලෙස නිවාස පාදක සාත්තු සේවකයින් 50 ක් යැවීමේ වැඩසටහන යටතේ 2016.05.25 වන දින ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ ඊශ්‍රායල් රජය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත. එම ගිවිසුමට අනුව බඳවා ගැනීම් සිදුකර ඇත. එම ගිවිසුම් ප්‍රකාරව 2017,2018,2019 වර්ෂවලදී 26 දෙනෙකු ඊශ්‍රායලය වෙත බඳවා ගෙන ඇත. 2020.02.24 දින නැවත වරක් අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇති අතර, ඒ අනුව දැනට සාත්තු සේවක තනතුරු සඳහා ශ්‍රී ලාංකිකයින් පුහුණුකර ඊශ්‍රායල් රාජ්‍යයට යැවීමේ කාර්යය සිදු කෙරෙමින් පවති. මෙම ගිවිසුම යටතේ 2023.09.18 දිනට 569 දෙනෙකු ඊශ්‍රායලයේ සාත්තු සේවා රැකියා සඳහා යොමු කර ඇති අතර ගිවිසුම් 826 ක් ලැබී ඇත. මින් 21 දෙනෙකු සැප්තැම්බර් 20 සහ 04 දෙනෙකු සැප්තැම්බර් මස 26 දිනයන්හිදි ඊශ්‍රායලය බලා පිටත්වීමට නියමිතව ඇත. ගිවිසුම් 76 ක් අවලංගු වී ඇති අතර ගිවිසුම් ලද 31 දෙනෙකු රැකියා ලබා ගැනීම ප්‍රතික්ෂේප කර ඇත. ඉතිරි 125 දෙනෙකුගේ ගිවිසුම් සම්බන්ධයෙන් අවශ්‍ය වීසා අයදුම් කර ඇත. **(ආ) දකුණු කොරියාව සමඟ අත්සන් කර ඇති අවබෝධතා ගිවිසුමේ ප්‍රගතිය** ශ්‍රී ලංකා රජය හා කොරියානු ජනරජය අතර අවසන් වරට අත්සන් කරන ලද 2017.11.17 අවබෝධතා ගිවිසුම යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් මේ වන විට සිදු කෙරෙමින් පවති.

		2019 වසරේ සිට 2023.09.26 දින දක්වා කොරියානු රාජ්‍ය වෙත රැකියා සඳහා යොමු කර ඇති ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් සංඛ්‍යාව ඇමුණුම් **03** දක්වා ඇත. 2023 වසරට අදාළව රැකියා අවස්ථා 6500 ක් ලබා දී ඇති අතර නැව් තැනීමේ කර්මාන්තය සඳහාම අවස්ථා විවර වී ඇති බැවින් ඒ සඳහා ද ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් යොමු කිරීමට කටයුතු සිදු කෙරෙමින් පවතී.
3	**දේශීයව හා විදේශීයව පවතින ශ්‍රම ඉල්ලුමට සරිලන පරිදි නිපුණතාවයෙන් යුතු ශ්‍රමිකයන් විදේශ රැකියා සඳහා යොමු කිරීමට හැකි වැඩපිළිවෙලක්.** **කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග** නිපුණතාවයෙන් යුතු ගුණාත්මක ශ්‍රමිකයන් විදේශ රැකියා සඳහා යොමු කරවීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොවීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය. එසේම, පසුගිය කාල පරිච්ඡේදය තුළ පුහුණු හා අර්ධ පුහුණු වර්ගීකරණ යටතේ රටට ලැබී නිබුණු ආර්ථිකමය වැඩි වාසි සහගත රැකියා අවස්ථා සඳහා ශ්‍රමිකයන් විදේශගත කිරීමට කටයුතු කිරීමට නොහැකි වී ඇති බව ද කාරක සභාව නිරීක්ෂණය කළේය. නිපුණතා ඇති ශ්‍රමිකයන් සඳහා විදේශ රටවලින් ඇති ඉල්ලුම සැපිරීම සඳහා ජාතික විගමණික ශ්‍රමික සංක්‍රමණික ප්‍රතිපත්තියේ අරමුණක් වන නිපුණතාවයෙන් අඩු ශ්‍රමිකයන්ගේ ධාරිතාව වර්ධනය කිරීමට වෘත්තීය පුහුණුව සපයන ආයතන සමඟ විදේශ සේවා නියුක්ති කාර්යාංශය ක්‍රමවත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද, සංවර්ධන නිලධාරීන් මාර්ගයෙන් වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නේද හා ශ්‍රම වෙළෙඳපොළ ඉල්ලුම පිළිබඳ පර්යේෂණ සිදු කරන්නේද යන්න පිළිබඳව කාරක සභාව ප්‍රශ්න කළේය.	විදේශ ශ්‍රම වෙළෙඳපොළ ඉලක්ක කර ගනිමින් සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ ධාරිතාව වැඩි කිරීම සඳහා පුහුණු වැඩසටහන් හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ඔවුන් යටතේ පවතින ආයතන මඟින් ක්‍රියාත්මක කිරීම අරමුණු කොට ගෙන 2021.02.09 දින විදේශ රැකියා අමාත්‍යාංශය හා නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය , සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත. මෙහි ප්‍රථම අදියර වශයෙන් දෙපාර්ශවයේ ඒකාබද්ධ කමිටුවක් මඟින් සත්කාරක සේවා ක්ෂේත්‍රය, සාත්තු සේවය, රියදුරු, ගොඩනැගිලි නඩත්තු කටයුතු සේවා, යන්ත්‍රෝපකරණ ක්‍රියාකරුවන් යන කාණ්ඩ සඳහා කෙටි කාලීන අවශ්‍යතා හඳුනාගන්නා ලද අතර, ඒ අනුව අපේක්ෂිත ශ්‍රමික ප්‍රමාණය පුහුණු කොට විදේශ රැකියා ශ්‍රම වෙළඳපලට ලබා දීම පිළිබඳව අදාළ පුහුණු කටයුතු ආරම්භ කිරීම සඳහා 2022.01.27 දින නිපුණතා සංවර්ධන නව නිපයුම් අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී. මේ යටතේ මේ වන විට එම අමාත්‍යාංශයේ මැදිහත් වීම මඟින් සූපවේදය, ආහාරපාන සේවා , ජලනල කාර්මික, ශීතකරණ හා වායු සමීකරණ, වැද්දුම් ශිල්පය යන ක්ෂේත්‍ර සඳහා පුද්ගලයන් 1,084 දෙනෙකුට පුහුණුව ලබා දී ඇත. වෘත්තීය පුහුණු අධිකාරිය සමඟ කාර්යාංශය අවබෝධතා ගිවිසුමකට එළඹ ඇති අතර, කාර්යාංශය විසින් ලබාදුන් තොරතුරු පදනම් කර ගනිමින් විදේශ රැකියා ඉලක්කගත කර කෙටි කාලීන පාඨමාලා 42 ක් හඳුන්වා දී ඇති බව වෘත්තීය පුහුණු අධිකාරිය දන්වා ඇත. තවද මෙම පාඨමාලා හදාරන පුහුණුලාභීන් ගණන 2023.09.27 දිනට 1072 ක් බව වෘත්තීය පුහුණු අධිකාරිය දන්වන ලදී. තවද, ගෘහස්ථ ගෘහ පාලන සහකාර තනතුරු සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අධීක්ෂණය යටතේ පවත්වා ගෙන යනු ලබන පෞද්ගලික පුහුණු මධ්‍යස්ථාන පහත පරිදි වේ.

	විදේශ රැකියා අමාත්‍යාංශය හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සමඟ පුහුණු වැඩසටහන් සඳහා 2021 වර්ෂයේදී ගිවිසුම්ගත වී කමිටුවක් පිහිටුවා ඒ මඟින් වැඩි ඉල්ලුමක් ඇති රැකියා ක්ෂේත්‍ර පිළිබඳ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය දැනුවත් කර ඇති බව ද තානාපති කාර්යාල මඟින් රැකියා ඉල්ලුම පිළිබඳ විමසීම් සිදු කරන බව ද ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. කෙසේ වුවද, අදාළ රටවල කම්කරු දෙපාර්මේන්තු මාර්ගයෙන් රැකියා අවස්ථා පිළිබඳ සෘජුව විමසිම් කිරීම් උචිත බව කාරක සභාවේ අදහස විය. තව ද, විදෙස් රැකියා සඳහා යාමට බලාපොරොත්තුවන්නන්ට තමන් රැකියාවට යාමට උපයෝගී කර ගන්නා පෞද්ගලික විදේශ රැකියා ඒජන්සියේ තොරතුරු පිළිබඳව විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවියෙන් මාර්ගගතව තහවුරු කර ගැනීමට වැඩ පිළිවෙළක් සැකසිය යුතු බව කාරක සභාව යෝජනා කළේය.	ග්‍රීන්වේ පුහුණු මධ්‍යස්ථානය, වර්ල්ඩ් ටුවර්, GLP ට්‍රාන්ස්ලේෂන් ඇන්ඩ් කන්සල්ටන්සි (පුද්) සමාගම, වෘත්තිය පුහුණු අධිකාරිය, ජාත්‍යන්තර වෘත්තිය තාක්ෂණික පාසල (පුද්) සමාගම, ලා ස්කයි ගේට් (පුද්.) සමාගම, අරුණ ට්‍රැවල්ස් ආයතනය, එන්.එස්. ලංකා විදේශ රැකියා ආයතනය, එන්.එක්සලන්ට් මැනෙජ්මන්ට් සර්විස් ආයතනය. කාර්යාංශය සමඟ ගිවිසුම් අත්සන් කළ ජපන් භාෂා ඉගැන්වීම් ආයතන සහ තාක්ෂණික වෘත්තිය පුහුණු ආයතන පහත පරිදි වේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය, යුෂු ජපන් පාසල, G.L.P. Language Academy, Macrocom Institute of Technology, Ganmo Japanese Language Center, British Campus, සියාසි ඇකඩමි පුද්ගලික සමාගම, සවුත් ඒෂියා ජැපනීස් ලැන්ග්වේජ් ස්කූල්, ලිය සවිය, ඔරියන් උසස් අධ්‍යාපන ආයතනය, ඩෙයිමා කන්සල්ටන්සි, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.
	එසේම, ඉහළ වැටුප් ගෙවන රටවල රැකියා සඳහා ශ්‍රමිකයන් යැවීම ප්‍රවර්ධනය කිරීම රටේ දැනට පවතින ආර්ථික අර්බුදය සඳහා ඇති එක් විසඳුමක් බවද කාරක සභාව පෙන්වා දුන්නේය.	බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන වල විස්තර හා ඒවාට ලැබී ඇති කාර්යාංශය විසින් අනුමත කර ඇති සියලුම විදේශ රැකියා ඇබෑර්තු පිළිබඳ විස්තර (රැකියා කාණ්ඩය, රට, වලංගු ඇබෑර්තු ප්‍රමාණය, අවම වැටුප, අවශ්‍ය සුදුසුකම්, අයකරනු ලබන අනුමත උපරිම ගාස්තුව, රැකියා ඇණවුමේ වලංගු කාල සීමාව සහ ආහාර, නවාතැන් පහසුකම්, ගුවන් ටිකට්පත, වෛද්‍ය පහසුකම් පිළිබඳ විස්තර) පරීක්ෂා කර බැලීම සඳහා කාර්යාංශයේ නිල වෙබ් අඩවිය මඟින් පහසුකම් සලසා ඇත. එමෙන්ම, ඉහත සඳහන් තොරතුරු කාර්යාංශයේ පැය 24 පුරා ක්‍රියාත්මක තොරතුරු මැදිරියේ ක්ෂණික දුරකථන අංකය වන 1989 අංකය ඔස්සේ සහ 011 2880500 යන ස්ථාවර දුරකථන අංකය ඔස්සේ පරීක්ෂා කර ගැනීමට මහජනතාව වෙත පහසුකම් සලසා

		ඇත. විදෙස් රැකියා සඳහා යාමට බලාපොරොත්තුවන විගමණික සේවකයින්ට අදාළ විදේශ රැකියා නියෝජිත ආයතනය පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිල වෙබ් අඩවිය (www.slbfe.lk) මඟින් පරීක්ෂා කිරීම සඳහා පහසුකම් සලසා දී ඇත. එමෙන්ම, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිල වෙබ් අඩවිය (www.slbfe.lk) Online Job Bank වෙබ් ද්වාරය මඟින් Hot Jobs (රැකියා අවස්ථා) පරීක්ෂා කර ඒ සඳහා අයදුම් කිරීමට මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පහසුකම් සලසා ඇත. ලොව පුරා විවිධ රටවල් වලින් ශ්‍රී ලාංකිකයන් වෙත ලබා ගත හැකි රැකියා අවස්ථා පිළිබඳව විස්තර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත දන්වන ලෙස ඉල්ලා කාර්යාංශය විසින් විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉල්ලීම්කර ඇති අතර, ඒ අනුව එම අමාත්‍යාංශ විසින් 2021.12.14 දිනෙන් යුතුව චක්‍රලේඛ පණිවිඩ අංක 416 යටතේ එතෙර පිහිටි සියලුම ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාල වෙත චක්‍රලේඛයක් යොමු කර ඇත. ඊට ප්‍රතිචාර වශයෙන් ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාල විසින් කාර්යාංශය වෙත විටින් විට ලැබෙන රැකියා පිළිබඳ තොරතුරු යොමු කරන අතර, කාර්යාංශය විසින් එම තොරතුරු බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන වෙත හා මහජනතාව වෙත ලබා දෙනු ලැබේ. මීට අමතරව ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (International Labour Organization – ILO) සහයෝගය ඇතිව කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශය විසින් UAE, Saudi Arabia, Qatar, Kuwait, USA, Oman, UK, Germany, Japan, Canada, Australia, France, Singapore, Italy, Korea යන විදේශ රටවල ඇති ඉහළ ප්‍රතිලාභ සහිත විදේශ රැකියා අවස්ථා පිළිබඳව වෙළඳපොළ සමීක්ෂණයක් සිදු කරමින් පවතී. කෙසේ වෙතත්, ඉහළ වැටුප් ගෙවනු ලබන බොහෝ රටවල්වල වැඩිවශයෙන් රැකියා අවස්ථා ඇත්තේ ඉහළ වෘත්තීය මට්ටම්වල ඉහළ නිපුණතා සහිත වෘත්තිකයන්ට (විශේෂයෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීකයන් වන හෙදියන්, වෛද්‍යවරුන් වැනි) බව

නිරීක්ෂණය වී ඇති අතර, එබඳු බොහෝ රටවල්වලට යන වෘත්තිකයන්ට සිය පවුල් වල සාමාජිකයින් ගෙන්වා ගැනීමට හා එම රටේ ස්ථිර පදිංචියටද පහසුකම් සළස්වනු ලබන බව නිරීක්ෂණය වේ.

මෙහිදී එම රැකියා ක්ෂේත්‍රවල බුද්ධි ගලනය සිදුවන්නාක් මෙන්ම එම වෘත්තිකයන් එම රටවල පදිංචි වූ පසුව, තම ඉපයුම් වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට නොඑවන බවට අනුමාන කළ හැකිය. එබඳු බොහෝ පිරිසක් මෙරට නිදහස් අධ්‍යාපනය තුළින් විශ්ව විද්‍යාල උපාධිය අවසන් කිරීම දක්වා අධ්‍යාපනය ලබා ඇති අයවලුන් වන අතර, මේ තුළින් මහජන මුදල් ආයෝජනය කර බිහි කරනු ලබන වෘත්තිකයින් ඇතුලු බුද්ධිමතුන්ට විදේශ රටවල ස්ථිර පදිංචිය ලබා ගැනීමද සිදුවේ. එම වෘත්තිකයින් මෙරට රැඳී සිටීමින් උපයන ආදායමින් ශ්‍රී ලංකාවේ රජයට ලැබෙන බදු ආදායම අහිමි වීම ද මේ හේතුවෙන් සිදු වේ. ඒ අනුව, එසේ ඉහල නිපුණතා සහිත වෘත්තිකයින් ඉහල වැටුප් ලැබිය හැකි රටවල රැකියා හරහා ස්ථිර පදිංචියට යාම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හෝ රජය විසින් දිරි ගැන්වීම කොතරම් යෝග්‍යද යන්න සළකා බැලිය යුතු කරුණකි.

වෘත්තිය පුහුණු පාඨමාලා හැදෑරීම මඟින් විදේශ රැකියාවක් අත්කර ගත් තැනැත්තෙක් සඳහා, ඔහු විදේශ රැකියාවක් අත්කර ගත් පසු, ඔහුගේ වෘත්තිය පුහුණු පාඨමාලා හැදෑරීමේ ගාස්තුව රුපියල් ලක්ෂයක් (100,000.00) දක්වා කාර්යාංශය විසින් ප්‍රතිපුරණය කිරීම සඳහා කටයුතු සම්පාදනය කර ඇත. එමෙන්ම ජපන් භාෂා N4 විභාගය සමත් තැනැත්තන් සඳහා ඔවුන් ජපානයේ රැකියා අවස්ථාවක් අත්කර ගැනීමෙන් පසුව ඔවුන් වෙත රුපියල් ලක්ෂයක් (100,000.00) දක්වා වැයවූ පාඨමාලා ගාස්තු ප්‍රතිපුරණය කිරීමද කාර්යාංශය මඟින් සිදු කෙරේ.

4	**2017 සිට 2022 ජුනි 30 වන විට සේවා වර්ගීකරණ 7ක් යටතේ ලැබී ඇති රැකියා අවස්ථා** මේ යටතේ එකතුව 1,659,398 ක රැකියා අවස්ථා රටට ලැබී තිබුණු අතර ඉන් 534,197 ක් ගෘහ සේවිකාවන් සඳහා ද නුපුහුණු සේවා වර්ගීකරණය යටතේ රැකියා අවස්ථා 468,489 ක් ද ලැබී තිබුණු බව ද සඳහන් කෙරිණි. එමෙන්ම පුහුණුවලත් ශ්‍රමිකයින් සඳහා අවස්ථා 586,591 ක් ලැබී තිබුණ ද ඒ සඳහා 37,092 ක් පමණක් විදේශගත කර තිබුණි.	ශ්‍රී ලංකාවට 1,659,398 ක රැකියා අවස්ථා ලැබුණු බව සඳහන් කර තිබුණත් , මෙම සංඛ්‍යාව ලැබුණු රැකියා අවස්ථාවන් නොව රැකියා සඳහා අපේක්ෂිත ප්‍රමාණයයි. එවන් සංඛ්‍යාවන් ශ්‍රී ලංකාවට ලැබුණු පසු එය ශ්‍රී ලංකාවේ විදේශ රැකියා නියෝජිත ආයතන අතර, බෙදී යාමක් සිදුවේ. එම රැකියා අවස්ථා වෙනත් ශ්‍රමිකයන් සපයන රටවලටත් ලබාදේ. ඒ සියලු රැකියා අතරින් වඩාත් සුදුසු පුද්ගලයින් තෝරා ගෙන බඳවා ගැනීම සිදුවේ. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් රැකියා සඳහා විදේශගත වන අයගේ දත්ත පවත්වාගෙන යන අතර, ශ්‍රී ලංකා මහබැංකුව කාර්යාංශයෙන් එම තොරතුරු ලබාගෙන ඔවුන්ගේ වාර්ෂික වාර්තාවටද ඇතුලත් කරනු ලැබේ. වෙනත් රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන විසින් ද කාර්යාංශයෙන් අදාළ දත්ත ලබා ගනු ලැබේ.
	කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග විදේශ රැකියා නියුක්ති කාර්යාංශය විසින් ජාතික මට්ටමින් විදේශ ගත වන ශ්‍රමික සංඛ්‍යාලේඛන පවත්වා ගැනීම පැහැර හැර ඇති බව මෙහිදී වැඩිදුරටත් අනාවරණය විය. එසේම, පුහුණු ශ්‍රමිකයන් විදේශ ගත කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කිරීමට විදේශ රැකියා අමාත්‍යාංශය මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කර ඇති 951 ක් වන සංවර්ධන නිලධාරීන් එම අරමුණ ඉටු කිරීමට අපොහොසත් වී ඇති බව කාරක සභාවේදී අනාවරණය විය. රටට ලැබෙන විදේශීය පුහුණු ශ්‍රමික පුරප්පාඩු පිරවීමට නිශ්චිත වැඩපිළිවෙලක් නොමැති වීම හේතුවෙන් ශ්‍රමිකයන් පෞද්ගලික ඒජන්සි මාර්ගයෙන් විශාල පිරිවැයක් දරා අනාරක්ෂිතව විදේස්ගත වන බව ද කාරක සභාව නිරීක්ෂණය කළේය. 2017 හා 2018 වර්ෂවල දී විදේශ ගත ප්‍රේෂණ ඇ.ඩො. මිලියන 7 ඉක්මවූ බව ද එය එවකට දළ දේශීය නිෂ්පාදිතයෙන් 8% ක් පමණ වූ	ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ රැකියා අවස්ථාවන් කාර්යාංශයටත්, පෞද්ගලික ඒජන්සි ආයතන වලටත් පෞද්ගලිකව විදේශ රැකියා අපේක්ෂකයන් වෙතත් ලැබීම සිදුවේ. විදේශ රැකියා ඒජන්සි මඟින් සොයා ගන්නා රැකියා අවස්ථාවන් තානාපති කාර්යාලය මඟින් අනුමත කළ පසු කාර්යාංශය මඟින් නියමිත ක්‍රමවේදයකට යටත්ව බඳවා ගැනීම සිදුකර විදේශගත කිරීමට අවස්ථාව සලසා දේ. මෙහිදී බඳවා ගැනීම් ගාස්තු නිසි පරිදි පරීක්ෂා කර බලා අනුමත කර කාර්යාංශ වෙබ් අඩවියේද පලකරන අතර, කිසියම් වූ පුද්ගලයෙකුගෙන් විදේශ රැකියා ඒජන්සි ආයතන වැඩිපුර මුදල් අය කළ හොත් ඒ සම්බන්ධයෙන් විමර්ශනයන් සිදු කර නීතිමය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

	බව ද ප්‍ර.ග.නි. / ග.නි. ප්‍රකාශ කළේය. කෙසේ වුවද, කොවිඩ් වසංගත තත්ත්වය මත එම ආදායමෙහි යම් පසුබෑමක් සිදුවුවද නැවත එය වර්ධනය වෙමින් පවතින බවද, 2017 වර්ෂයේ සිට ගෘහ සේවයට විදෙස් ගත වන ප්‍රතිශතය සමස්ථ විදෙස් ගත වීම් වලින් 30% දක්වා අඩු වී ඇති බව ද මේ වසරේදී 24% දක්වා අඩු වී ඇති බව ද ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. 2019,2020,2021 වර්ෂයන්හිදී විගමණික පුහුණු ශ්‍රමික ප්‍රතිශතය පිළිවෙලින් 30%, 31% හා 33% පමණ වූ බවත් වර්තමානයේ අනෙකුත් රටවලින් ඇති ශ්‍රමික ඉල්ලුම අනුව එළඹෙන වර්ෂ 3 ඇතුළත මෙම ප්‍රමාණය 40% ක් දක්වා වැඩි කර ගැනීමට අපේක්ෂා කරන බවත් ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය.	
5	**විදේශ රැකියා අමාත්‍යාංශයේ මැදිහත් වීම මත කාර්යාංශය විසින් විදේශ රාජ්‍යන් සමඟ අත්සන් කරන ලද ගිවිසුම්.** **කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග** • ජපානයේ SSW Programme (2019) සඳහා ශ්‍රමිකයන් 14,302 ක් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි කරගෙන තිබුණද එම රැකියා සඳහා කිසිවෙකු යොමු කොට නොතිබුණි. • 2022.01.18 දින එංගලන්තය හා උතුරු අයර්ලන්තය සඳහා සාත්තු සේවකයන් යොමු කිරීමට අත්සන් කරන ලද ගිවිසුම අනුව 2022.10.10 දින වන විටත් කිසිවෙකු ඒ සඳහා යොමු කොට නොතිබුණි.	හෙද සහයක (Nursing Care), ආහාර සේවා (Food Service) හා කෘෂිකාර්මික (Agriculture) යටතේ විභාග පැවැත්වීමට ශ්‍රී ලංකාව තුල ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් සිටින බව ජපන් Immigration Services ආයතනය වෙත තහවුරු කිරීම සඳහා මෙසේ ලියාපදිංචි කිරීම් සිදු කරන ලදී. ජපානයට විදේශ ශ්‍රමිකයන් බඳවා ගන්නා එක් ක්‍රමවේදයක් ලෙස විශේෂිත වූ නිපුණතා සහිත ශ්‍රමිකයින් බඳවා ගැනීමේ ක්‍රමවේදය Specified Skilled Workers Programme (SSWP) සඳහන් කළ හැකිය. 2019 ජුනි 19 වන දින ජපානය හා ශ්‍රී ලංකාව අතර සහයෝගිතා ගිවිසුම (MOC) අත්සන් කලද අනුමත ක්ෂේත්‍ර 14 න් ක්ෂේත්‍ර 03 ක් යටතේ විභාග ලංකාවට ලබා ගත හැකි වූයේ 2022 වසර තුලදීය. කාර්යාංශය විසින් මෙම බදවා ගැනීම් වැඩසටහන ඉදිරියට ක්‍රියාත්මක කිරීම සඳහා එහි උප අනුබද්ධිත ආයතනයේ ඉල්ලීම මත එම ආයතනය වෙත භාර දෙන ලදි. ඒ අනුව ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි ආයතනය ඇමරිකාවේ කර්ම සර්විස් ආයතනය සමඟ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමට පියවර ගෙන ඇත.

	• 2016.05.03 දින ඇමරිකා එක්සත් ජනපදයේ Karma Services LLC ආයතනය සමග අත්සන් කළ ගිවිසුමට අනුව ශ්‍රමිකයන් 2 දෙනෙකු පමණක් යවා තිබුණි. ගිවිසුම් කාලය වර්ෂ 5 කට පසු දිර්ඝ කර ගැනිමේ හැකියාව පැවතිය ද එම කාර්යය ඉටු වී නොතිබිණි.	කාර්යාංශය වැඩසටහන ක්‍රියාත්මක කළ ආකාරය සහ මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ආකාරය පහත පරිදි වේ. **හෙද වෘත්තිකයන් සඳහා ඇමරිකාවේ රෝහලක වෘත්තිය තත්ත්වය ලබා ගැනීම සඳහා වන ක්‍රමවේදය.** 1. ශ්‍රී ලංකාවේ හෙද සංගමයේ ලියාපදිංචි අයෙකු වීම. 2. එතැන් සිට පිළිගත් රෝහලක වසර දෙකක පළපුරුද්ද (Medical, Surgical, ICU,ETU, Incentive Care)ඇදන් 100 ක් වත් අවම වශයෙන් එම රෝහලේ තිබිය යුතුවීම. 3. ඉංග්‍රීසි භාෂා හැකියාව. IELTS Speaking 7 Average 6.5 ඉහත අවස්ථා සම්පූර්ණ කරන අයෙකුට සිය අයදුම්පත්‍රය ඉදිරිපත්කළ හැකිය.එහිදී හෙද සංගමය විසින් අදාළ හෙද නිළධාරීන්ගේ පුහුණුව පිළිබඳව තොරතුරු ඇතුළත් සහතිකකළ පිටපත (Transcript) ලබාදිය යුතුය. එය ඇමරිකාවේ CGFNS ආයතනය වෙත ලබාදිය යුතුයි. ඒ සමග ඉහත සඳහන් සියලු සුදුසුකම් ඉදිරිපත් කළ යුතුයි. 4. **විශ්වාසනීයත්වය ඇගයීම.** Credential Analysis ආයතනය වෙත ඉදිරිපත් කළ සහතික හා ලේඛන පිළිබඳව ඇගයීමක් සිදුකර එම තොරතුරු පිළිබඳව විශ්වාසනීයතාවය තහවුරු කරගත් පසු NCLEX විභාගයට ඉදිරිපත් වීමට උපදෙස් හා පුහුණුව ලබා දෙයි. 5. NCLEX - National Certificate of License Examinations මෙම විභාගය ශ්‍රී ලංකාවේ දැනට පවත්වන්නේ නැත.ඒ සඳහා ඉන්දියාවේ චෙන්නායිවලට යා යුතුය. මෙම විභාගය සමත් වූ පසු ඒ අනුව ඇමරිකාවේ අදාළ රෝහල මගින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර ශ්‍රී ලංකාවේ ඇමරිකානු තානාපති කාර්යාලයද සම්මුඛ පරීක්ෂණය පවත්වයි. මේ සඳහා යන සියළු වියදම් කර්ම සර්විස් ආයතනය විසින් දරයි. (American Dollar – 2500 ක් පමණ)

		ප්‍රගතිය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් සිය අනුබද්ධිත ආයතනය වන ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය වෙත මෙම වැඩසටහන භාර දීමෙන් පසුව සුදුසුකම් ලැබූ හෙදියන් 03 දෙනෙක් සඳහා වීසා ලබා ගෙන එයින් 02 දෙනෙකු මේ වන විට ඇමරිකාවට පිටත් කර ඇත. ඉතිරි අයව ඇමරිකානු තානාපති කාර්යාල වීසා මුද්‍රණය කිරීමෙන් පසුව පිටත් කළ හැකි වේ. සුදුසුකම් ලැබූ තවත් හෙද නිලධාරින් 04 දෙනෙක්ගේ වීසා සඳහා අවශ්‍ය CGFNS ජාත්‍යන්තර සහතිකය ලැබී ඇත. තවද IELTS සුදුසුකම් ලැබ අමෙරිකානු හෙද විභාගයට (NCLEX) පෙනී සිටීමට අවශ්‍ය හැදෑරීම සිදු කරන හෙද නිළධාරිණියන් 10 දෙනෙක් සිටී. 1. ඇමරිකාවේ හෙද වෘත්තියට බඳවා ගැනීම පිළිබඳව කාරණා සම්බන්ධයෙන් විශේෂ සාකච්ඡාවක් කාර්යාංශය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ පවත්වා නොමැත. නමුත් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිකයින් සඳහා විදෙස් රටවල (ඇමරිකාව , එංගලන්තය) රැකියා අවස්ථා ලබා ගැනීම පිළිබඳ සාකච්ඡා සෞඛ්‍ය අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, විදේශ රැකියා අමාත්‍යාංශය, වෙනත් පුහුණු ආයතන සහ පෞද්ගලික රෝහල් සම්බන්ධ කර ගනිමින් විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් පවත්වන ලදී. එම රැස්වීම් වලට කාර්යාංශය සහභාගි වී අදහස් හා යෝජනා ඉදිරිපත් කර ඇත 2. හෙද වෘත්තිය සඳහා ඇමරිකාව විසින් ලබා දෙන මෙම අවස්ථාව දිනාගන්නා අයට Green Card අවස්ථාව ලැබෙන බැවින් ඔවුන් සිය පවුල පිටින්ම ඇමරිකාවට පිටත් වේ. එසේ පිටත් වීමෙන් පසුව ඔවුන් සිය පවුලම ඇමරිකාවේ ජීවත් වන බැවින් ඔවුන් ඇමරිකාවේ ජීවන රටාවට සහ දරුවන්ගේ අධ්‍යාපනයට මුදල් වියදම් කිරීමට සිදු වන අතර, ශ්‍රී ලංකාවට විදේශ විනිමය එවීම පිළිබඳ කාරණාව එතරම් සාර්ථක නොවන ඉලක්කයක් බව සඳහන් කරමි. කෙසේ වෙතත් සුදුසුකම් සපුරාගන්නා අයට ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික

	එසේම, ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම විසින් 2022 වර්ෂයේදී රටවල 04 කින් ලැබී තිබුණ රැකියා අවස්ථා 885 ක් සඳහා ශ්‍රමිකයන් යොමුකර නොතිබුණු බව ද මෙහිදී අනාවරණය විය. මේ දක්වා ශ්‍රමිකයන් විදේශගත කිරිම සඳහා රටවල් අතර ගිවිසුම් 24 ක් අත්සන් කර ඇති බව ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.	සමාගම මැදිහත් වීමෙන් අවම වියදමකින් ඇමරිකාවේ හෙද වෘත්තියට යාමට අවස්ථාව උදාකර දෙනු ලබයි. 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගමෙහි අනුමත රැකියා ඇණවුම් වලට අදාලව රැකියා අවස්ථා 1475ක් ලැබී ඇත. ඉන් රැකියා අවස්ථා 885කට අදාලව ශ්‍රමිකයින් යොමු කරවීමට නොහැකි වීමට පහත කරුණු බලපා ඇත. 1. **වසර 02ක් පුරාවට අයදුම්කරුවන් අනුයුක්ත කිරීමේ අරමුණින් රැකියා ඇණවුම් ලබා දීම.** **මෙහිදී රැකියා ඇණවුමක සඳහන් වනුයේ එම රැකියා ඇණවුම ඉදිරිපත් කරනු ලබන අවස්ථාවේදී පවතින සත්‍ය ඇබෑර්තු සංඛ්‍යාව නොව වසර 02ක් තුළ (රැකියා ඇණවුමේ වලංගු කාලය තුළ) ලබා දීමට අපේක්ෂිත ඇබෑර්තු සංඛ්‍යාව වේ.** 2. ශ්‍රමිකයින් එක් රැකියා ඇණවුමකට සුදානම් කිරීමේදී සැලකිය යුතු කාලයක් ගත වීම. උදාහරණ - 2022 වර්ෂය තුළ රැකියා අවස්ථා ලබා දී 2023 වසරේදී විදේශ රැකියා සඳහා යොමු කිරීම. 3. අදාළ විදේශ රටවල් මගින් වීසා නිකුත් කිරීමට කල් ගත වීම 4. විදේශ රැකියා ලබා දෙන ඇතැම් ව්‍යාපාරික ස්ථාන තාවකාලිකව බඳවා ගැනීම් නවතාලීම 5. විදේශ රැකියා ලබා දෙන ආයතන ගිවිසුම් කඩ කිරීම 6. එකම රැකියා ඇණවුම මෙරට මෙන්ම තරහකාරී රටවල් වලට සහ රැකියා නියෝජිත ආයතන වලට ලබා දීම. 7. පුහුණු ශ්‍රමිකයින්ගේ පුහුණු සහතික හා සේවා සහතික එම රැකියා නියෝජිතයින්ගේ ඉල්ලීම හා නොගැලපීම. උදා : මෙරට දක්ෂතා සහිත පුහුණු පින්තාරු ශිල්පීන් සිටියද කොරියානු රැකියා නියෝජිතයින් අපේක්ෂා කරනු ලබන ඩිප්ලෝමා හෝ උපාධි සහතික ඔවුන් සතු නොවීම නිසා මෙම රැකියා අහිමි වේ.

	ජපානයේ Technical Intern Trainees (TIT) වැඩසටහන යටතේ 498 දෙනෙකු විදේශ ගත කොට ඇති බව සඳහන් විය. SSW Programme යටතේ රැකියා ලබා දීම සඳහා නව ක්ෂේත්‍ර විවර කරගනිමින් පවතින බවද මේ යටතේ රැකියා ලබා දීමට භාෂා පරීක්ෂණයක් හා කුසලතා පරීක්ෂණයක් පැවැත්වෙන බවද ඒ සඳහා ශ්‍රමිකයන් පුහුණු කිරීමට දිගු කාලීන වැඩපිළිවෙලක් අවශ්‍ය බවද හෙතෙම වැඩිදුරටත් සඳහන් කළේය. වර්තමානය වන විට SSW Programme සඳහා පුද්ගලයන් 8 දෙනෙකු යොමු කොට ඇති බව ප්‍ර .ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.	ජපන් රැකියා අවස්ථා සඳහා ශ්‍රී ලාංකිකයින් යොමු කිරීමේ ප්‍රගතිය (අ) සීමාවාසික තාක්ෂණික පුහුණුලාභීන් (TITS) රැකියා සඳහා බඳවා ගැනීමේ සංඛ්‍යා ලේඛන පහත පරිදි වේ. 2022 වර්ෂය - 599 2023.09.19 දිනට -599 (ආ) විශේෂ කුසලතා සහිත (SSW) රැකියා සඳහා බඳවා ගැනීම් 2022 වර්ෂය - 21 2023.09.19 දිනට -119
	එංගලන්තය හා උතුරු අයර්ලන්තයේ පවතින රැකියා ඇබෑර්තු සඳහා මෙතෙක් සාන්තු සේවකයන් යොමු නොකිරීමට හේතුව වනුයේ ගිවිසුම් ප්‍රකාර මෙම වැඩසටහනේ ක්‍රමවේදය සැකසීමට පත් කළ යුතු කමිටුව සඳහා ශ්‍රී ලංකා කමිටුවේ සාමාජික නාම යෝජනා ලබා දුන්නද මහා බ්‍රිතාන්‍යයෙන් මේ වන තෙක් එම කමිටුව සඳහා නාමයෝජනා නොලැබීම බව ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.	ශ්‍රී ලංකාවේ හෙද කවුන්සිලයේ ලියාපදිංචිය ලබා ගත් නිපුණතා සහිත හෙදියන් එංගලන්තයේ හෙද වෘත්තිය සඳහා යොමු කිරීමට ශ්‍රී ලංකා රජයේ එකඟත්වයට අනුව එංගලන්ත, උතුරු අයර්ලන්ත ගිවිසුම අත්සන් කෙරිණි. එම ගිවිසුමට අනුව එංගලන්තය හා සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ අනුමැතිය ලත් එංගලන්තයේ නියෝජිත ආයතන, ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී නියෝජිත ආයතන අතර ගිවිසුම් අත්සන් කර කාර්යාංශ නීති රීතීන් හා විධිමත් ක්‍රමවේදවලට අනුව අනුමත රැකියා ඇණවුම් මාර්ගයෙන් හෙද වෘත්තිය සඳහා හෙදියන් යොමු කළ හැකිය. ඒ අනුව ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිත ආයතනය, එංගලන්තයේ Welcome Skills ආයතනය සමඟ හෙදියන් යැවීම සඳහා ගිවිසුමක් අත්සන් කෙරිණි. නමුත් එංගලන්තයේ රැකියා නියෝජිත ආයතන එක හෙදියක් එරටට ගෙන්වා ගැනීම වෙනුවෙන් පවුම් 6000 – 8000 ක් අතර විශාල මුදලක් අය කරනු ලැබේ. Welcome Skills ආයතනය විසින් සම්මුඛ පරීකෂණයක් පවත්වා සුදුසු හෙදියන් තෝරා ගත් පසු ගෙවිය යුතු මුළු මුදලින් 25% ක් ගෙවිය යුතු බවට කෙරුණු සන්නිවේදනය සමඟ ගැටලුව පැන නැගුණු අතර, තෝරාගත් හෙදි වෘත්තිකයන් වෙනුවෙන් වීසා ලබා දීමකින් තොරව කිසිදු මුදලක්

		ප්‍රේෂණය කළ නොහැකි බවට විදේශ රැකියා ඒජන්සි සමාගම විසින් Welcome Skills ආයතනයට දන්වා සිටින ලදී. ආයතනයක් ලෙසට එම අවදානම ගත නොහැකි වුණ අතර වර්තමානයේදීත් එය අනුමත රැකියා ඇණවුමක් ලෙසට පවතී. වෙනත් බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතනයක් මඟින් එක් හෙදියක් අදාළ ගිවිසුම් ප්‍රකාරව එංගලන්තය වෙත යවනු ලැබිණි. නමුත්, ක්‍රියාත්මක ගිවිසුම තුළ පැන නැඟී ඇති ගැටලු කවරේද, හඳුනාගත් ප්‍රශ්ණ සඳහා දෙපාර්ශව සම්මුතින් සකස් කර ගැනීම සඳහා, වැඩසටහනේ ක්‍රමවේදය සැකසීමට කමිටුවක් පත්කළ යුතු බවට යෝජනා වී, ශ්‍රී ලංකාව ඒ සඳහා කේන්ද්‍රීය පුද්ගලනාමද සහිතව කමිටු නාම යෝජනා එංගලන්තය වෙත ඉදිරිපත් කළද, මහා බ්‍රිතාන්‍යයෙන් කමිටුව සඳහා නාමයෝජනා ඉදිරිපත් නොවිණි. නමුත් වර්තමානයේදී කමිටුවක් නොමැති වුවද මෙම ගිවිසුම ප්‍රකාරව එංගලන්තය සඳහා හෙදියන් යොමු කළ හැකි අතර, ඒ සඳහා එරට විදේශ රැකියා නියෝජිත ආයතන විසින් ඉල්ලුම් කරන මුදල් ප්‍රමාණයන් ගෙවීම් කළ හැකි නම් සහ IELTS ඉංග්‍රීසි භාෂා කථනය සඳහා 7 ක් සහ සාමාන්‍යය 6.5 ක් හෝ PTE (Pearson Test of English) විභාගයෙන් අවශ්‍ය අපේක්ෂිත සාමාන්‍ය ලකුණු ප්‍රමාණයන් ලබා ගන්නේ නම් සුසුදුකම් සහිත හෙදියන් එම රටවල සාත්තු සේවා රැකියා සඳහා යොමු කළ හැකිය.
	Karma Services LLC ආයතනය සමග අත්සන් කල ගිවිසුමට අනුව මේ සඳහා ඉදිරිපත් වූ 425 දෙනෙකුගෙන් අදාළ පුහුණුවෙන් පසු තෝරා ගැනීම සඳහා පවත්වන ලද පරීක්ෂණයෙන් සමත් වූයේ හෙදියන් 3 දෙනෙකු පමණක් බව ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. තවද, ඇමරිකා එක්සත් ජන පදය මඟින් පවත්වන ලද පරීක්ෂණයෙන් ද සමත් වූ හෙදියන් 3 දෙනෙකු මේ වන විට එම රැකියා සඳහා යොමු කළ බව හෙතෙම වැඩි දුරටත් ප්‍රකාශ කළේය. හෙද සේවයේ රැකියා සඳහා විශාල ඉල්ලුමක් විදෙස් රටවල පවතින බව අනාවරණය විය.	ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් 2022 වසරේ සිය අනුබද්ධිත ආයතනය වන ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය වෙත මෙම වැඩසටහන භාර දීමෙන් පසුව සුදුසුකම් ලැබූ හෙදියන් 03 දෙනෙක් සඳහා වීසා ලබා ගෙන එයින් 02 දෙනෙකු මේ වන විට ඇමරිකාවට පිටත් කර ඇත. සුදුසුකම් ලැබූ තවත් හෙද නිලධාරින් 04 දෙනෙක්ගේ වීසා සඳහා අවශ්‍ය (CGFNS) Commission of Graduate Foreign Nurses School ජාත්‍යන්තර සහතිකය ලැබී ඇත. එම 04 දෙනාගේ වීසා ඇමරිකානු තානාපති කාර්යාලය විසින් ලබා දුන් පසු පිටත් කළ හැකි වේ.

		තවද IELTS සුදුසුකම් ලැබ අමෙරිකානු හෙද විභාගයට (NCLEX) පෙනී සිටීමට අවශ්‍ය හැදෑරීම් සිදු කරන හෙද නිළධාරිණියන් 10 දෙනෙකද සිටී. 1 ඇමරිකාවේ හෙද වෘත්තියට බඳවා ගැනීම පිළිබඳව කාරණා සම්බන්ධයෙන් විශේෂ සාකච්ඡාවක් කාර්යාංශය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ පවත්වා නොමැත. නමුත් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිකයින් සඳහා විදෙස් රටවල (ඇමරිකාව , එංගලන්තය) රැකියා අවස්ථා ලබා ගැනීම පිළිබඳ සාකච්ඡා සෞඛ්‍ය අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, විදේශ රැකියා අමාත්‍යාංශය, වෙනත් පුහුණු ආයතන සහ පෞද්ගලික රෝහල් සම්බන්ධ කර ගනිමින් විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් පවත්වන ලදී. එම රැස්වීම් වලට කාර්යාංශය සහභාගි වී අදහස් හා යෝජනා ඉදිරිපත් කර ඇත 2 හෙද වෘත්තිය සඳහා ඇමරිකාව විසින් ලබා දෙන මෙම අවස්ථාව දිනාගන්නා අයට Green Card අවස්ථාව ලැබෙන බැවින් ඔවුන් සිය පවුල පිටින්ම ඇමරිකාවට පිටත් වේ. එසේ පිටත් වීමෙන් පසුව ඔවුන් සිය පවුලම ඇමරිකාවේ ජීවත් වන බැවින් ඔවුන් ඇමරිකාවේ ජීවන රටාවට සහ දරුවන්ගේ අධ්‍යාපනයට මුදල් වියදම් කිරීමට සිදු වන අතර, ශ්‍රී ලංකාවට විදේශ විනිමය එවීම පිළිබඳ කාරණාව එතරම් සාර්ථක නොවන ඉලක්කයක් බව සඳහන් කරමි. කෙසේ වෙතත් සුදුසුකම් සපුරාගන්නා අයට ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම මැදිහත් වීමෙන් අවම වියදමකින් ඇමරිකාවේ හෙද වෘත්තීයට යාමට අවස්ථාව උදාකර දෙනු ලබයි. තවද හෙදියන් 7 දෙනෙකු CGFNS ආයතනය විසින් පවත්වනු ලබන (NCLEX) National Council Licensure Examination යන විභාග සඳහා පෙනී සිටීමට සුදානම් කර ඇත. විදේශ ගත වීමට අවශ්‍ය හෙදියන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ගැනීම සඳහා සියලු උපදෙස් කාර්යාංශය විසින් සහ විදේශ රැකියා (පුද්ගලික) සමාගම විසින් නිවැරදි මගපෙන්වා දීම සිදු කරනු ලැබේ. හෙදියන් IELTS විභාගය සමත්ව පැමිණෙන හෙදියන් NCLEX විභාගයට පෙනී සිටීම සඳහා කටයුතු සුදානම් කරනු ලැබේ. Karma Services ආයතනය NCLEX

		විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත හෙද නිලධාරීන් සඳහා මාර්ගත ක්‍රමවේදය ඔස්සේ (On Line) පාඨමාලාවට සම්බන්ධ කරනු ලැබේ. කෙසේ වුවත්, සුදුසුකම් සපුරා ගන්නා අයට ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම මැදිහත් වීමෙන් අවම වියදමකින් ආමරිකාවේ Karma Services ආයතනය වෙත හෙද වෘත්තියට යාමට අවස්ථාව උදා කර ඇත. තවද ඇමරිකාව වැනි රටකට යැවිය හැකි සුදුසුකම් හා නිපුණතා සහිත හෙදියන් ශ්‍රී ලංකාව සතු බවට සාත්තු සේවය සඳහා රැකියා පුරප්පාඩු පවතින වෙනත් රටවලටද මෙය පෙන්විය හැකි අවස්ථාවක් ලෙසටද මෙම Karma Services රැකියා ඇණවුම හඳුන්වා දිය හැක. ඇමරිකාවේ Karma Services ආයතනය සහ ශ්‍රී ලංකාව අතර ඇති ගිවිසුම් ප්‍රකාරව මෙම හෙද බඳවා ගැනීම දක්වා ඇත්තේ "සදාචාරාත්මක බඳවා ගැනීම් (ethical recruitment procedure) ක්‍රමවේදයක් " අනුගමනය කර බඳවා ගැනීම් සිදු කරන ලෙසටයි. හෙදියන් විසින් දරනු ලබන සියලු වියදම් Karma Services ආයතනය විසින් ප්‍රතිපූරණය කිරීම සිදු කරන අතර, හෙදියන් ඇමරිකාවට යොමු කිරීම සඳහා කටයුතු කරන විදේශ රැකියා ආයතන වෙත පරිපාලන වියදම් ලෙස ඇමරිකානු ඩොලර් 100 ක් ගෙවන බවට දක්වා තිබුණි.
	නිර්දේශ/ නියෝග • ශ්‍රී ලාංකික හෙද හෙදියන් විදෙස් රැකියා සඳහා යොමු කිරීම සඳහා ඔවුන්ගේ ඉංග්‍රීසි ප්‍රවීණතාවය වැඩි දියුණු කිරීම සඳහා වැඩ පිළිවෙලක් අදාළ අංශ විසින් දියත් කල යුතු බව. • Karma services LLC හරහා හෙදියන් ඇමරිකා එක්සත් ජනපදය වෙත යැවීමේ ක්‍රියාමාර්ගය සහ විදේශගත වීමට අපේක්ෂා කරන හෙදියන්ගේ IELTS ලකුණු පිළිබඳ දත්ත ඇතුළත් සවිස්තරාත්මක වාර්තාවක් සති 2ක් තුළ කාරක සභාවට ලබා දෙන ලෙසද, මේ	IELTS සහ PTE විභාග සඳහා සුදානම් කිරීමට විශාල වශයෙන් පෞද්ගලික මට්ටමින් පාඨමාලා රාශියක් ශ්‍රී ලංකාව තුළ පැවැත්වෙන අතර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් හෝ ශ්‍රී ලංකා විදේශ රැකියා (පුද්ගලික) සමාගම විසින් ශ්‍රී ලාංකික හෙද හෙදියන්ගේ ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය IELTS හෝ PTE හි අපේක්ෂිත මට්ටම ඉහළ නැංවීමට සහ අපේක්ෂිත මට්ටමට ළඟා කර වීම සඳහා පාඨමාලා මෙහෙයවීම සහ ඉගැන්වීම සඳහා විශේෂ නිපුණතාවයක් තිබිය යුතු ගුරුවරු බඳවා ගැනීම ඉතා අසීරු කාර්යක් වන අතර, කාර්යාංශ විෂය පථයෙන් බාහිර වූවක්ද වනු ඇත.

	පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශය සමග පවත්වන ලද රැස්වීම් කාර්ය සටහන් ජාතික විගණන කාර්යාලයට පිටපතක් සහිතව කාරක සභාවට ලබා දෙන ලෙසද කාරක සභාව ප්‍ර.ග.නි./ ග.නි. වෙත නියෝග කළේය. මේ පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ලබා දී ඇත. විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි ආයතනය වෙත බදවා ගැනීමේ වැඩසටහන භාර දී ඇත. (මේ පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශය සමග පවත්වන ලද රැස්වීම් කාර්ය සටහන් කාරක සභාවට එවා නැත.)	රාජ්‍ය ආයතනයක් ලෙස විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ බඳවා ගැනීමේ කාර්ය සම්බන්ධයෙන් වූ ක්‍රියා පිළිවෙත පැහැදිලි ලෙස සකස් කර නිවැරදිව විදේශ රැකියා සඳහා යොමු කිරීම සඳහා ක්‍රියා කිරීම, ජාත්‍යන්තර වෙළඳපොළෙහි පවත්නා විදේශ රැකියා පුරප්පාඩු සම්බන්ධයෙන් මහජනතාව නිරන්තර දැනුවත් කිරීම්, රටවල් සමඟ එකඟතා ගිවිසුම් අත්සන් කර පෞද්ගලික විදේශ රැකියා නියෝජිත ආයතන හරහා අදාළ බඳවා ගැනීම් සිදු කරවීමට අවස්ථා සලසා දීම තුළින් පහසුකම් සලසා දී ඇත.
6	**විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ලැබෙන පැමිණිලි** නියැදි පරීක්ෂාවට ලක්වූ 2015-2021 කාලය තුළ කාර්යාංශයට ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් 29,407 ක් (66%) ගෘහ සේවයට ගිය කාන්තා පාර්ශවයෙන් ලැබී තිබුණු අතර මරණ 12 කට අදාළ පැමිණිලි ද ඒ අතර විය. **කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග** පැමිණිලි වලින් 95% ක් මැද පෙරදිග රටවලින් ලැබී තිබුණු බවද මෙහිදී සඳහන් කෙරිණි. විදෙස්ගත ශ්‍රමිකයකුගේ මරණයකදී ඒ පිළිබඳ මැදිහත්ව කටයුතු සිදු කරන්නේ විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් බවද දේහයන් ගෙන්වා ගැනීමට ඥාතීන්ට වියදම් දැරීමට අපහසු වූ අවස්ථා වල අදාළ තානාපති කාර්යාල මගින් විදේශ සේවා නියුක්ති කාර්යාංශය දැනුවත් කළ විට අඩු අදායම්ලාභීන් බවට තහවුරු කළ ග්‍රාම සේවක සහතිකය මත එම වියදම් කාර්යාංශයේ කම්කරු සුබසාධන අරමුදල මගින් දරන බවද ප්‍ර.ග.නි. / ග.නි.ප්‍රකාශ කළේය. විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් විදෙස්ගත ශ්‍රමිකයන්ගෙන් ලැබෙන පැමිණිලි පිළිබඳ කටයුතු කිරීමේ පසුගාමීත්වය කාරක සභාවේ අප්‍රසාදයට ලක් විය	**Statistics on Close complaints – Complaints Received from 2015 to 2022** Year of Complaint / No of complaints solved within 3 months / No of complaints solved within 6 months / No of complaints solved by spending more than 6 months / Total 2015: 3,923 / 3,708 / 2,876 / 10,507 2016: 2,912 / 3,181 / 2,280 / 8,373 2017: 2,674 / 2,263 / 1,228 / 6,165 2018: 2,391 / 1,690 / 871 / 4,952 2019: 2,500 / 1,333 / 922 / 4,755 2020: 1,229 / 1,766 / 2,018 / 5,013 2021: 1,264 / 1,563 / 1,100 / 3,927 2022: 2,694 / 817 / 635 / 4,146 Total: 19,587 / 16,321 / 11,930 / 47,838

		2015 සිට 2022 දක්වා කාර්යාංශය වෙත විගමනික ශ්‍රමිකයන් වෙතින් පැමිණිලි 47,838 ක් ලැබී තිබූ අතර ඉන් පැමිණිලි 19,587 ක් (40 %) මාස 3 ක් ඇතුළතද, 16,321 ක් (35%) ක ප්‍රතිශතයක් මාස 6 ක් ඇතුළතද, 11,930 ක් (25%) මාස 6 ට වඩා වැඩිකාලයක් තුලදි විසඳා ඇත. මාස 6 කට වඩා කාලයක් පැමිණිලි විසඳීම සඳහා හේතු වී ඇත්තේ ශ්‍රමිකයින් සිරගත වීමට ලක් වීම, සේවා ස්ථානයෙන් පලා යාම, රටින් පිටවීමේ තහනමට ලක් වී තිබීම (Travel ban), නීත්‍යානුකූල නොවන රැඳිසිටීම් සහ රෝගාතුර වීම හේතුවෙන් රෝහල් ගතව සිටීම වැනි කරුණු මතය. • බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන මඟින් බඳවාගැනීම් සිදුකර රැකියා සඳහා විදේශගත වූ ශ්‍රමිකයන්ට අදාළව කාර්යාංශ වෙත පැමිණිලි වාර්තා වේ. එකී පැමිණිලි සේවා ගිවිසුම කඩවීම හා සේවකයාගේ පෞද්ගලික හේතූන් මත ගිවිසුම්ගත සේවා කාලය අවසන් වීමට පෙර සේවය ප්‍රතික්ෂේප කර ශ්‍රී ලංකාව වෙත ගෙන්වා ගැනීමට අදාල ඉල්ලීම් වේ. • පැමිණිල්ලේ ස්වභාවය අනුව, එම ගැටළුව විසඳීමට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග අදාල දේශීය/විදේශීය රැකියා නියෝජිත ආයතන හරහා සහ විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සහාය ඇතිව ගනු ලබයි. • බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතනය කැඳවා පැමිණිලි පරීක්ෂණ සිදුකරන අතර, අදාල ගැටළුව විසඳන ලෙස දන්වමින් යම්කිසි සාධාරණ කාලසීමාවක් ලබාදෙමින් නියෝගයන්/විධානයන් ප්‍රදානය කරනු ලබයි. යම්හෙයකින් අදාල නියෝජිත පැමිණිලි පරීක්ෂණ සඳහා සහභාගී නොවුනහොත් සහ ගැටළුව විසඳීමට ලබාදෙන අදාල කාලසීමාව ඇතුළත එකී නියෝජිත ආයතනය එම ගැටළුව විසඳීමට අපොහොසත්වුවහොත් එම ආයතනය වෙත කාර්යාංශය විසින් ලබාදී ඇති අනුමැතීන් අත්හිටුවීම හෝ එකී බලපත්‍රලාභීට එරෙහිව නීතිමය පියවර ගැනීම සිදුකරයි. මෙහිදී නීතිමය පියවර ගැනීමේදී යම්කිසි කාලසීමාවක් ඒ සඳහා ගතවේ.

		• තවද, දේශීය නියෝජිත ආයතනය සමඟ ව්‍යාපාර කරන විදේශයන්හි නියෝජිත ආයතනය ව්‍යාපාර කටයුතු අත්හිටුවීම සහ වෙනත් පැමිණිලි මත එකී නියෝජිත ආයතන කාර්යාංශය විසින් අසාධු ලේඛනගත කිරීම/ අනුමැතීන් අත්හිටුවීම යන හේතූන් මත පැමිණිලි විසඳීමට විදේශ නියෝජිතගේ සහයෝගය ලබාගත නොහැකි අවස්ථාවලදී, අදාල රටෙහි බලයලත් ආයතන හරහා මෙම ගැටළු විසඳීමට අදාල ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලට සිදුවේ. එවැනි අවස්ථාවලදී එක් එක් රටවල ගැටළු විසඳීමේ ක්‍රියාවලිය ප්‍රමාදයන් හේතුවෙන් පැමිණිලි විසඳීමට යම්කිසි කාලයක් ගතවේ.
7	**කාරක සභාවට සති 2ක් තුළ ලබා දිය යුතු වාර්තාවන්.** **කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග** 1. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ආයතනික සැලැස්ම අනුව සකස් කරන ලද ක්‍රියාකාරී සැලසුම්, **විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලසුම් ඉදිරිපත්කර ඇත.** 2. විදෙස් රටවලින් ලැබී ඇති ශ්‍රමික වෙළෙඳපොළ ඉල්ලුම් පිළිබඳ (පුහුණු/නුපුහුණු) විස්තර වෙන් වශයෙන්, **2022.10.31 දිනට සංඛ්‍යා දත්ත ලබා දී ඇත** 3.විදෙස්ගත වන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා අදාළ රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සමඟ ඇති කරගත් ගිවිසුම් හා පුහුණු අවස්ථා ඇති කිරීමට ගත් ක්‍රියාමාර්ග හා ඉදිරියේ දී වෘත්තීය පුහුණුව ලබා දීම සඳහා සැලසුම් කර ඇති වැඩසටහන්/ක්‍රමවේදයන්, **මේ පිළබඳ විස්තර ඇතුලත් වාර්තාවක් එවා ඇත.**	**1. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලසුම්** 2022.11.03 දිනැතිව රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත යොමු කර ඇත. **2.විදෙස් රටවලින් ලැබී ඇති ශ්‍රමික වෙළෙඳපොළ ඉල්ලුම් පිළිබඳ (පුහුණු/නුපුහුණු) විස්තර** ඇතුළත් වාර්තාව 2022.11.03 දිනැතිව රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත යොමු කර ඇත. 3.කාර්යාංශය මගින් පවත්වනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලාවන් සඳහා කැමැත්තක් දක්වන රාජ්‍යය හා පෞද්ගලික පුහුණු කිරීමේ ආයතන වෙත ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. ඒ අනුව, නේවාසික ගෘහස්ථ ගෘහපාලන පුහුණු පාඨමාලාව පවත්වාගෙන යාමට රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේම ආයතන වෙත පුවත්පත් දැන්වීමක් පල කරන ලදී. මේ වන විට ගෘහස්ථ ගෘහපාලන පුහුණු පාඨමාලාව පැවැත්වීමට පහත සඳහන් ආයතන සඳහා අනුමැතිය ලබා දී ඇත.

- ග්‍රීන්වේ පුහුණු මධ්‍යස්ථානය
- වර්ල්ඩ් ටුවර් ආයතනය
- GLP ට්‍රාන්ස්ලේෂන් ඇන්ඩ් කන්සල්ටන්සි (පුද්) සමාගම
- වෘත්තීය පුහුණු අධිකාරිය
- ජාත්‍යන්තර වෘත්තීය තාක්ෂණික පාසල (පුද්) සමාගම
- ලා ස්කයි ගේට් (පුද්.) සමාගම
- අරුණ ට්‍රැවල්ස් ආයතනය
- එන්.එස්.ලංකා විදේශ රැකියා ආයතනය
- එන් එක්සලන්ට් මැනේජ්මන්ට් සර්විසස් ආයතනය

එසේම, තාක්ෂණ හා වෘත්තීය පුහුණු ආයතන සහ භාෂා පුහුණු ආයතන 19 ක් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කර ඇති අතර පුහුණු ශ්‍රමිකයින් විදේශ වෙළඳ පොළ ඉලක්ක කරගනිමින් පාඨමාලා හදුන්වා දීම සහ ගුණාත්මක ශ්‍රමික පිරිසක් ඇති කිරීම මෙහි අරමුණ වේ. එළෙස ගිවිසුම්ගත ආයතන පහත සඳහන් වේ.

- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
- ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය
- යූඡූ ජපන් පාසල
- G.L.P Language Academy
- Macrocom Institute Of Technology
- Ganmo Japanese Language Center
- British Campus
- සියාසි ඇකඩමි පුද්ගලික සමාගම
- සවුත් ඒෂියා ජැපනීස් ලැන්ග්වේජ් ස්කූල්

		• ලිය සවිය • ඔරියන්ට් උසස් අධ්‍යාපන ආයතනය • ඩෙයිමා කන්සල්ටන්සි • ජාතික සමූපකාර සංවර්ධන ආයතනය • ගම්පල නගර සභාව • Asian Institute of Business & Technology • Korea Lanka School of Hospitality & Hotel Management • DIOM Academy for Technical Skills • Dream J (PVT) LTD • S D A Agencies (PVT) LTD
	4. විදේශ රැකියා වෙළෙඳපොළ පිළිබඳ සිදුකර ඇති පර්යේෂණ, එම ඉල්ලුම සැපිරීමට සකසා ඇති සැලසුම් හා වෙළෙඳපොළ ශ්‍රමික ඉල්ලුම සැපයුම අතර පරතරය හා එසේ වීමට හේතු, **කාර්යාංශය සම්බන්ධව 2022.10.27 කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීමේදී ආයතනයේ පර්යේෂණ අංශය, සැලසුම් හා මෙහෙයුම් අංශය ඒකාබද්ධ කර සුදුසු නිළධාරීන් අනුයුක්ත කිරීමට සභාපතිතුමාට යෝජනා කර ඇත. මේ දක්වා සිදු කර ඇති පර්යේෂණ පිළිබඳ වාර්තාවක් එවා ඇත.** 5. විවිධ ක්ෂේත්‍ර සඳහා විදේශ ශ්‍රමික ඇබෑර්තු ප්‍රමාණය, අදාළ වාර්තාව එවා ඇත. 6. ශ්‍රමික සුබසාධන හා සුබසාධන අරමුදල පිළිබඳ විස්තර, අදාළ වාර්තාව එවා ඇත.	4.එම කාලය දක්වා සිදු කර ඇති පර්යේෂණ පිළිබඳ වාර්තාවක් 2022.11.03 දිනැතිව රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත යොමු කර ඇත. 5. විවිධ ක්ෂේත්‍ර සඳහා විදේශ ශ්‍රමික ඇබෑර්තු ප්‍රමාණය ඇතුලත් අදාළ වාර්තාව 2022.11.03 දිනැතිව රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත යොමු කර ඇත. 6.ශ්‍රමික සුබසාධන හා සුබසාධන අරමුදල පිළිබඳ විස්තර ඇතුලත් වාර්තාව 2022.11.03 දිනැතිව රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත යොමු කර ඇත.

	7. අමාත්‍යාංශය යටතේ බඳවාගත් සංවර්ධන නිලධාරීන් 951 ස්ථානගත කිරීම හා ඔවුන්ගේ කාර්යභාරය **එක් එක් දිස්ත්‍රික්ක වෙත අනුයුක්ත කරන ලද සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව පිළිබඳව වාර්තාවක් එවා ඇත. ඔවුන්ගේ කාර්යභාරය පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් එවා ඇත.**	කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ විදේශ රැකියා ප්‍රවර්ධනය හා විගමණික පවුල්වල සුභ සාධනය සඳහා මේ වන විට සංවර්ධන නිලධාරීන් 936 දිවයිනේ දිස්ත්‍රික්ක 25 තුලම දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර ඇත. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරන සංවර්ධන නිලධාරීන් සඳහා පවරා ඇති රාජකාරී කටයුතු ඔවුන් විසින් පැහැර හැරීම් සහ ඔවුන් විසින් විෂමාචාරයන් සිදුකිරීම් සම්බන්ධයෙන් අමාත්‍යාංශය මගින් අවධානය යොමු කොට පහත දක්වා ඇති පරිදි සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනීමට හා පසුවිපරම් කිරීමට කටයුතු කර ඇත. විෂමාචාරයන් සිදුකිරීම සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ආරම්භ කර එම කටයුතු සිදු වෙමින් පවතින සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව 30කි. මේ වන විට චෝදනා පත්‍ර නිකුත් කර විධිමත් විනය ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂිත සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව 07 ක් වන අතර තවත් සංවර්ධන නිලධාරීන් 07 දෙනෙකු සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණ කටයුතු සිදුවෙමින් පවතී. තනතුර අතහැර යාමේ නිවේදන නිකුත් කර ඇති සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව 14ක් වන අතර එක් සංවර්ධන නිලධාරියෙක් සේවයෙන් පහකර ඇත. සංවර්ධන නිලධාරීන් 10 දෙනෙක් සඳහා විනය නියෝග නිකුත් කොට විනය ක්‍රියාමාර්ග අවසන් කර ඇත. එසේම සංවර්ධන නිලධාරීන් 07 දෙනෙකුට අවවාද ලිපි නිකුත් කොට එමගින් විනය කටයුතු අවසන් කර ඇත. මෙම නිලධාරීන් වෙත පවරා ඇති රාජකාරී කටයුතු පිළිබඳ විස්තරාත්මක තොරතුරු පූර්ව වාර්තාව මඟින් ලබා දී ඇත. විදේශ රැකියා ප්‍රවර්ධනය සඳහා සංවර්ධන නිලධාරීන් විසින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ දී පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී. • ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙතින් ලබාගන්නා රැකියා අවස්ථා

		සම්බන්ධ තොරතුරු ප්‍රාදේශීය මට්ටමෙන් දැනුවත් කිරීම. • විදේශ රැකියා අපේක්ෂිතයින් හඳුනාගැනීම සහ පුහුණුව අවශ්‍ය පිරිස් පුහුණු ආයතන වෙත යොමුකිරීම. • සුරක්ෂිත සංක්‍රමණය, මිනිස් වෙළඳාමේ ගොදුරක් නොවීම, මූල්‍ය සාක්ෂරතාවය වැනි ක්ෂේත්‍රයට අදාල කරුණු සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීම. • දරුවන්ගේ රැකවරණ වැඩපිළිවෙල පිළිබඳ වාර්තා නිකුත් කිරීම සහ ලබාදුන් රැකවරණ වැඩපිළිවෙල සම්බන්ධයෙන් නිරන්තර අධීක්ෂණය. • විගමනික ශ්‍රමික පවුල්වල ආරක්ෂාව සහ සුබසාධනය වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. • විදේශ රැකියා සඳහා යොමුවීමට අපේක්ෂිත පිරිස, විදේශ රැකියා ගනුවූවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්, නැවත පැමිණි විගමනික ශ්‍රමිකයින් සම්බන්ධ කර ගනිමින් විගමනික ශ්‍රමික සංගම් පිහිටුවීම. විගමනික ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා සම්බන්ධ වෙමින් ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩසටහන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායි මට්ටමින් සිදු කිරීම වෙනුවෙන් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සංවර්ධන නිළධාරින්ගේ රාජකාරි කටයුතු අධීක්ෂණය සහ ප්‍රගතිය සමාලෝචනය වෙනුවෙන් ගරු විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරින්ගේ සහ අදාල දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සහභාගිත්වයෙන් පළාත් මට්ටමින් විශේෂ ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වනු ලබයි. මේ යටතේ පළාත් 06 කට අදාල වැඩසටහන් මේ වනවිට අවසන් කර ඇති අතර, නැගෙනහිර පළාත් වැඩසටහන ඔක්තෝබර් මස 10 දින පවත්වන ලදි.

		• මෙයට සමගාමීව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සංවර්ධන නිලධාරින්ගේ රාජකාරී කටයුතු අධික්ෂණය සහ ප්‍රගතිය සමාලෝචනය වෙනුවෙන් එක් එක් පළාත්/ දිස්ත්‍රික් භාරව අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරින් 2023.04.26 දින සිට පත් කර ඇති අතර, එම නිලධාරින් ද තමා වෙත වගකීම් පැවරී ඇති දිස්ත්‍රික්කයන් හි නිලධාරින් සමඟ මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සම්බන්ධ වෙමින් ප්‍රගතිය සමාලෝචනය මෙන්ම නිලධාරින්ගේ ගැටළු, අදහස් ,යෝජනා ලබාගැනීම ද සිදුකරමින් පවතී. • එසේම මෙලෙස අමාත්‍යාංශය යටතේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සංවර්ධන නිලධාරින් විසින් විදේශ රැකියා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සිදුකරන රාජකාරී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා සම්බන්ධිත කාර්යයන් බැවින් මනා සම්බන්ධීකරණයකින් යුතුව සිදුකිරීම වෙනුවෙන් මෙම නිලධාරින් ඉදිරියේ දී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අනුයුක්ත කිරීම සම්බන්ධයෙන් ද පියවර ගනිමින් පවතී.
	8. තානාපති කාර්යාල හරහා ලැබී ඇති රැකියා අවස්ථාව පිළිබඳ තොරතුරු තානාපති කාර්යාල හරහා ලැබී ඇති රැකියා අවස්ථාව පිළිබඳ වාර්තාවක් එවා ඇත.	8.තානාපති කාර්යාල හරහා ලැබී ඇති රැකියා අවස්ථා පිළිබඳ තොරතුරු ඇතුලත් වාර්තාව 2022.11.03 දිනැතිව රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත යොමු කර ඇත.

	9. විදෙස් ශ්‍රමිකයන් පිළිබඳ පසුගිය වසර වලදී සකස් කර ඇති වාර්තාවල පිටපත් කාරක සභාවට ලබා දෙන ලෙස. **මෙම වාර්තා ලබා දී නැත.**	9.විදෙස් ශ්‍රමිකයන් පිළිබඳ පසුගිය වසර වලදී සකස් කර ඇති යාවත්කාලීන වාර්තාව මේ සමග අමුණා **ඇත. ඇමුණුම් 04**
8	**මෙදින සලකා බලන ලද විගණකාධිපති වාර්තාවේ නිරීක්ෂණ සම්බන්ධව ගත යුතු පියවර** **කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග** විගණකාධිපති වාර්තාවේ දක්වා ඇති අඩු ලුහුඩුකම් නිවැරදි කිරීමට ගන්නා පියවරයන් / සැලසුම් පිළිබඳ වාර්තාවක් සති 2 ක් තුළ කාරක සභාවට ලබා දෙන ලෙස **විගණකාධිපති වාර්තාවේ සඳහන් සියලුම නිරීක්ෂණයන් නිවැරදි කිරීමට ගන්නා පියවරයන් / සැලසුම් පිළබඳ වාර් තාවක් එවා ඇත.**	**මෙදින සලකා බලන ලද විගණකාධිපති වාර්තාවේ නිරීක්ෂණ සම්බන්ධව ගත යුතු පියවර** පිළිබඳ වාර්තාව 2022.11.03 දිනැතිව රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත යොමු කර ඇත.
9	**විදේශ සේවා නියුක්ති කාර්යාංශ ආයතනික සැලැස්ම** **කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග** විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ අරමුණු අනුව හා විගමණික ශ්‍රමික ජාතික ප්‍රතිපත්තිය අනුව ආයතනික සැලැස්ම ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ මීළඟ කාරක සභාවේදි පරිගණක ඉදිරිපත් කිරිමක් (Computer Presentation) සිදු කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කළේය. ශ්‍රී ලාංකිය විදේශ ශ්‍රමිකයන් සිටින රුමේනියා හා පෝලන්තය වැනි ඇතම් රටවල ශ්‍රමික ගැටළු විසදීමට ශ්‍රී ලංකා තානාපති සේවා නියෝජනයක් නොමැති වීම පිළිබඳ සොයා බලා කටයුතු කළ යුතු බවද කාරක සභාව අවධාරනය කළේය.	ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ හා විගමණික ශ්‍රමික ප්‍රතිපත්තියේ සඳහන් අරමුණු අනුව, කාර්යාංශයේ ආයතනික සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ආකාරය සඳහන් ඉදිරිපත් කිරීම (Power Point Presentation) මීළඟ කාරක සභාවේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

10	වෙනත් කරුණු විදේශ විනිමය උපයාගැනීම සඳහා රජය විසින් රාජ්‍ය සේවකයන් / ත්‍රිවිධ හමුදා නිලධාරින් විදේශ රැකියා සඳහා යොමු කිරීමට අවස්ථාව සැලසීම හා ඒ සඳහා යෝජිත ණය ලබා දීම් යෝජනා කිරීම අනුව අදාළ කටයුතු විධමත් කළ යුතු බවද .	විදේශ විනිමය උපයාගැනීම වෙනුවෙන් රජය විසින් රාජ්‍ය සේවකයින් විදේශ රැකියා සඳහා යොමු කිරීමට අවස්ථාව සැලසීම සහ ඔවුන් ලියාපදිංචි කර ගැනීම වෙනුවෙන් කාර්යාංශය විසින් වෙබ් ද්වාරයක් (Web Portal) විවෘත කර ක්‍රියාත්මකව පවතී. ඒ අනුව එම පරිගණක වැඩසටහනෙහි ලියාපදිංචි වී ඇති පුද්ගලයින් සංඛ්‍යාව 7358 කි. මේ වන විට රැකියා සඳහා විදේශ ගතවී ඇති සංඛ්‍යාව 477 කි. කාර්යාංශයේ පුහුණුව ලබා ගෙන ඇති සංඛ්‍යාව 280 කි. ත්‍රිවිධ හමුදා නිලධාරින් විදේශ රැකියා සඳහා යොමු කිරීමේ අවස්ථාව සලසා දීමට ශ්‍රී ලංකාව සහ මැලේසියාව අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. රජය විසින් රාජ්‍ය සේවකයන් / ත්‍රිවිධ හමුදා නිලධාරීන් විදේශ රැකියා සඳහා යොමු කිරීමට අවස්ථා සැලසීම වෙනුවෙන් IGRS පද්ධතිය මඟින් පහසුකම් සලසා ඇත.ත්‍රිවිධ හමුදාවන්හි අනිවාර්ය සේවාකාලය සම්පූර්ණ කර සේවයෙන් ඉවත් වී ඇති අයගේ තොරතුරු එක්රැස් කර විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත යොමු කර ඇත.ඉදිරියේ දී මේ සම්බන්ධයෙන් තෝරාගත් බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන සමඟ සාකච්ඡාවක් පැවැත්වීමට අපේක්ෂිතය.

	වයස අවුරුදු 5ට අඩු දරුවන් සිටින මව්වරුන් සඳහා රැකියා සඳහා විදේශගතවීමේ තහනම යළි ගෙන එන ලෙස ද කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි.වෙත අවධාරණය කළේය.	කාන්තාවන් රැකියා සඳහා විදේශගත වීමේ දී වයස අවුරුදු 2 ට වඩා අඩු දරුවන් සිටින කාන්තාවන් සඳහා විදේශගත වීමට අවසර නොදීමටත් වයස අවුරුදු 2- 18 අතර දරුවන්ගේ රැකවරණය සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රැකියාගත වීමට අවසර ලබාදීමටත් අමාත්‍ය මණ්ඩලය මඟින් අනුමැතිය ලබා දී ඇත. එම වයස අවුරුදු 05 ලෙස වැඩි කිරීම තුළින් ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති කාන්තාවන්ට එරෙහි සියලු හිංසන ක්‍රියා පිටු දැකීමේ සම්මුතිය (Convention on the Elimination of all forms of Discriminations Against Women) , එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ සම්මුතිය (United Nations Human Rights Convention), විගමනික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (International Convention on the Protection of the Rights of all Migrant Workers and Members of their Families) යනාදී සම්මුතීන් මගින් තහවුරු කර ඇති වෙනස්කොට නොසැලකීම, සංක්‍රමණය හා රැකියාවක් කිරීමට ඇති අයිතිය හා මානව අයිතිවාසිකම් උල්ලංඝනය පිළිබඳ චෝදනාවන්ට ලක්විය හැක. එමෙන්ම, රැකියා සඳහා විගමනය වීමට තවදුරටත් සීමා කිරීමෙන් පවත්නා ආර්ථික තත්වය යටතේ රැකියා අහිමි වීමෙන් හෝ ආදායම් තත්වයන් බිඳවැටීමෙන් ජීවනෝපාය පවත්වා ගැනීමට නොහැකි පවුල් සඳහා ඇති විකල්ප අවස්ථා සීමා වේ. එබැවින් එම පවුල් දැඩි අසීරුතාවන්ට ලක් වීමට ඉඩ ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 77

ආයතනයේ නම : කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය.

විමර්ශනය කරන ලද දිනය - 2022 නොවැම්බර් 22

කාරණා අංකය	කමිටුව හඳුනා ගන්නා ලද අඩුපාඩු	හඳුනා ගන්නා ලද අඩුපාඩු නිවැරදි කිරීම සඳහා කාර්යාංශය හා අමාත්‍යාංශය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග/ වර්තමාන තත්ත්වය
1	**Karma Services LLC ආයතනය සමග 2016 වර්ෂයේ අත්සන් කළ ගිවිසුම.** **කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග** මෙම ගිවිසුම අනුව මේ දක්වා අපේක්ෂිත පුහුණු හෙදියන් සංඛ්‍යාවක් ඇමරිකා එක්සත් ජනපදය වෙත යැවීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් අපොහොසත් වීම හා අදාළ ගිවිසුම වසර 5කට පසු දීර්ඝ කර ගැනීමේ හැකියාව පැවතිය ද මේ දක්වා ඒ පිළිබඳ අවශ්‍ය කටයුතු සිදු නොකිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවට විදේශ විනිමය උපයා ගැනීමට ඇති අවස්ථාවක් අහිමිවී යාම පිළිබඳ කාරක සභාව සිය අවධානය යොමු කළේය. ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය විසින් Karma Services LLC ආයතනය සමග වාර්ෂිකව අලුත් කිරීමේ පදනම මත ඉදිරි වර්ෂයට ගිවිසුම් අත්සන් කර ඇති බව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ග.නි.ප්‍රකාශ කළේය. මෙහිදි විදේශගත වීමට අපේක්ෂා කරන හෙදියන්ට අවශ්‍ය වන	කාර්යාංශය විසින් මෙම බදවා ගැනීම් වැඩසටහන ඉදිරියට ක්‍රියාත්මක කිරීම සඳහා එහි උප අනුබද්ධිත ආයතනයේ ඉල්ලීම මත එම ආයතනය වෙත භාර දෙන ලදි. ඒ අනුව ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි ආයතනය ඇමරිකාවේ කර්ම සර්විස් ආයතනය සමඟ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමට පියවර ගෙන ඇත. කාර්යාංශය වැඩසටහන ක්‍රියාත්මක කළ ආකාරය සහ මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ආකාරය පහත පරිදි වේ. **හෙද වෘත්තිකයන් සඳහා ඇමරිකාවේ රෝහලක වෘත්තිය තත්ත්වය ලබා ගැනීම සඳහා වන ක්‍රමවේදය.** 1. ශ්‍රී ලංකාවේ හෙද සංගමයේ ලියාපදිංචි අයෙකු වීම. 2. එතැන් සිට පිළිගත් රෝහලක වසර දෙකක පළපුරුද්ද (Medical ,Surgical ,ICU,ETU, Incentive Care) ඇදන් 100 ක්වත් අවම වශයෙන් එම රෝහලේ නිබිය යුතුවීම. 3. ඉංග්‍රීසි භාෂා හැකියාව. IELTS Speaking 7 Average 6.5 ඉහත අවස්ථා සම්පූර්ණ කරන අයෙකුට සිය අයදුම්පත්‍රය ඉදිරිපත්කළ හැකිය.එහිදී හෙද සංගමය විසින් අදාළ හෙද නිළධාරීන්ගේ පුහුණුව පිළිබඳව තොරතුරු ඇතුළත්

	IELTS ලකුණු ප්‍රමාණය ලබා ගැනීමට අවශ්‍ය ඉංග්‍රීසි භාෂා පුහුණු පහසුකම් ලබාදීමේ අවශ්‍යතාවය පිළිබඳ කාරක සභාව කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ග.නි. වෙත අවධාරණය කළේය. විදේශීය ශ්‍රම ඉල්ලුම සැපිරීමේදී දේශීය ශ්‍රම ඉල්ලුම සැපරීම අගනියට පත් නොවන ආකාරයට වැඩපිළිවෙලක් සකස් කිරීමේ අවශ්‍යතාවය ද කාරක සභාව පෙන්වා දුන්නේය.	සහතිකකළ පිටපත (Transcript) ලබාදිය යුතුය.එය ඇමරිකාවේ CGFNS ආයතනය වෙත ලබාදිය යුතුයි. ඒ සමග ඉහත සඳහන් සියලු සුදුසුකම් ඉදිරිපත් කළ යුතුයි. **4. විශ්වාසනීයත්වය ඇගයීම.** Credential Analysis ආයතනය වෙත ඉදිරිපත් කළ සහතික හා ලේඛණ පිළිබඳව ඇගයීමක් සිදුකර එම තොරතුරු පිළිබඳව විශ්වාසනීයතාවය තහවුරු කරගත් පසු NCLEX විභාගයට ඉදිරිපත් වීමට උපදෙස් හා පුහුණුව ලබා දෙනු ලැබේ. 5. NCLEX - National Certificate of License Examinations මෙම විභාගය ශ්‍රී ලංකාවේ දැනට පවත්වන්නේ නැත. ඒ සඳහා ඉන්දියාවේ චෙන්නායිවලට පිටත් විය යුතුය. මෙම විභාගය සමත් වූ පසු ඒ අනුව ඇමරිකාවේ අදාළ රෝහල මගින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර ශ්‍රී ලංකාවේ ඇමරිකානු තානාපති කාර්යාලයද සම්මුඛ පරීක්ෂණය පවත්වයි. මේ සඳහා යන සියළු වියදම් කර්ම සර්විස් ආයතනය විසින් දරයි. (American Dollar – 2500 ක් පමණ) **ප්‍රගතිය** ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් සිය අනුබද්ධිත ආයතනය වන ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය වෙත මෙම වැඩසටහන භාර දීමෙන් පසුව සුදුසුකම් ලැබූ හෙදියන් 03 දෙනෙක් සඳහා වීසා ලබා ගෙන එයින් 02 දෙනෙකු මේ වන විට ඇමරිකාවට පිටත් කර ඇත. ඉතිරි අයව ඇමරිකානු තානාපති කාර්යාල වීසා මුද්‍රණය කිරීමෙන් පසුව පිටත් කළ හැකි වේ. සුදුසුකම් ලැබූ තවත් හෙද නිලධාරින් 04 දෙනෙක්ගේ වීසා සඳහා අවශ්‍ය CGFNS ජාත්‍යන්තර සහතිකය ලැබී ඇත. තවද IELTS සුදුසුකම් ලැබ අමෙරිකානු හෙද විභාගයට (NCLEX) පෙනී සිටීමට අවශ්‍ය හැදෑරීම සිදු කරන හෙද නිළධාරිණියන් 10 දෙනෙක් සිටී.

		1. ඇමරිකාවේ හෙද වෘත්තියට බඳවා ගැනීම පිළිබඳව කාරණා සම්බන්ධයෙන් විශේෂ සාකච්ඡාවක් කාර්යාංශය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ පවත්වා නොමැත. නමුත් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිකයින් සඳහා විදෙස් රටවල (ඇමරිකාව, එංගලන්තය) රැකියා අවස්ථා ලබා ගැනීම පිළිබඳ සාකච්ඡා සෞඛ්‍ය අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, විදේශ රැකියා අමාත්‍යාංශය, වෙනත් පුහුණු ආයතන සහ පෞද්ගලික රෝහල් සම්බන්ධ කර ගනිමින් විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් පවත්වන ලදී. එම රැස්වීම් වලට කාර්යාංශය සහභාගී වී අදහස් හා යෝජනා ඉදිරිපත් කර ඇත 2. හෙද වෘත්තිය සඳහා ඇමරිකාව විසින් ලබා දෙන මෙම අවස්ථාව දිනාගන්නා අයට Green Card අවස්ථාව ලැබෙන බැවින් ඔවුන් සිය පවුල පිටින්ම ඇමරිකාවට පිටත් වේ. එසේ පිටත් වීමෙන් පසුව ඔවුන් සිය පවුලම ඇමරිකාවේ ජීවත් වන බැවින් ඔවුන් ඇමරිකාවේ ජීවන රටාවට සහ දරුවන්ගේ අධ්‍යාපනයට මුදල් වියදම් කිරීමට සිදු වන අතර, ශ්‍රී ලංකාවට විදේශ විනිමය එවීම පිළිබඳ කාරණාව එතරම් සාර්ථක නොවන ඉලක්කයක් බව සඳහන් කරමි. කෙසේ වෙතත් සුදුසුකම් සපුරාගන්නා අයට බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතනය මැදිහත් වීමෙන් අවම වියදමකින් ඇමරිකාවේ හෙද වෘත්තියට යාමට අවස්ථාව උදාකර දෙනු ලබයි. IELTS සහ PTE විභාග සඳහා සුදානම් කිරීමට විශාල වශයෙන් පෞද්ගලික මට්ටමින් පාඨමාලා රාශියක් ශ්‍රී ලංකාව තුළ පැවැත්වෙන අතර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් හෝ ශ්‍රී ලංකා විදේශ රැකියා (පුද්ගලික) සමාගම විසින් ශ්‍රී ලාංකික හෙද හෙදියන්ගේ ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය IELTS හෝ PTE හි අපේක්ෂිත මට්ටම ඉහළ නැංවීමට සහ අපේක්ෂිත මට්ටමට ළඟා කර වීම සඳහා පාඨමාලා මෙහෙයවීම සහ ඉගැන්වීම සඳහා විශේෂ නිපුණතාවයක් තිබිය යුතු ගුරුවරු බඳවා ගැනීම ඉතා අසීරු කාර්යක් වන අතර, කාර්යාංශ විෂය පථයෙන් බාහිර වූවක්ද වනු ඇත.

2	**කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් සම්බන්ධීකරණය කරනු ලබන ගුණාත්මකභාවයෙන් යුතු පුහුණු ශ්‍රමිකයන් විදෙස්ගත කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම සඳහා වන අන්තර් අමාත්‍යාංශ කමිටුව.** **කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග** කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් සම්බන්ධීකරණය කරනු ලබන විදේශ කටයුතු අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය ඒකාබද්ධව අන්තර් අමාත්‍යාංශ කමිටුවක් පිහිටුවා ගුණාත්මකභාවයෙන් යුතු පුහුණු ශ්‍රමිකයින් විදෙස්ගත කිරීම සඳහා ජාතික විගමණික ශ්‍රමික ප්‍රතිපත්තිය අනුව දින වකවානු සහිත පුහුණු වැඩපිළිවෙලක් සකස් කිරීම හා පුහුණු ශ්‍රමිකයින් විදෙස්ගත කිරීම සඳහා පැන නැඟී ඇති ගැටළු නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කර මාස 2ක් තුළ කාරක සභාවට වාර්තාවන් ලබා දිය යුතු බවට කාරක සභාව ප්‍ර.ග.නි./ ග.නි.වෙත නියෝග කළේය. **කාල රාමු සහිත අමාත්‍යාංශය විසින් ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කරනු ලබන කාර්යයන් ඇතුළත් අදාළ වාර්තාව කාරක සභාවට එවා ඇත.** මෙම අන්තර් අමාත්‍යාංශ කමිටුව විසින් සකස් කරනු ලබන වැඩපිළිවෙල සමාලෝචනය කර කාරක සභාවට වාර්තා කිරීම සඳහා කාරක සභාව විසින් පහත නම් සඳහන්	අදාළ අමාත්‍යාංශ නියෝජනය කරමින් අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් නම් කරන ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් කමිටුව විවිධ අවස්ථා වලදී රැස්වූ අතර තරහකාරී විදෙස් රැකියා වෙළෙඳපොල වෙත ගුණාත්මකභාවයෙන් හා නිපුණතාවයෙන් යුතු ශ්‍රම බලකායක් සැපයීම පරමාර්ථ කර ගනිමින් සකස් කරන ලද කඩිනම් ක්‍රියාකාරී සැලැස්ම 2023.01.18 දින රාජ්‍ය ගිණුම් කාරක සභාවේ අනු කමිටුව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2023.01.18 දින රැස් වූ අනුකමිටුවේ නියෝග අනුව විදෙස් රැකියා වෙළඳපළ වෙත ගුණාත්මකභාවයෙන් සහ නිපුණතාවයෙන් යුතු ශ්‍රම බලකායක් සැපයීම අරමුණු කරගනිමින් සකස් කරන ලද කඩිනම් ක්‍රියාකාරී සැලැස්ම 2023.03.01 දින රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව 2023.06.15 දිනට වූ ප්‍රගතිය මේ සමඟ ඉදිරිපත් කරමි.

	මන්ත්‍රීවරුන්ගෙන් යුතු අනුකමිටුවක් පත් කරන ලදි. • ගරු (වෛද්‍ය) සුදර්ශනි ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය (අනුකමිටු සභාපති) • ගරු ජේ.සී.අලවතුවල මහතා • ගරු අශෝක් අබේසිංහ මහතා • ගරු (අචාර්ය) මේජර් ප්‍රදීප් උදුගොඩ මහතා • ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා • ගරු වීරසුමන වීරසිංහ මහතා • ගරු (අචාර්ය) හරිනි අමරසූරිය මිය **අන්තර් අමාත්‍යාංශ කමිටු වැඩපිළිවෙල සමාලෝචනය කිරීමට අනුකමිටුව 2023.01.18 දින රැස් විය.**	
3	**ස්වයං ලියාපදිංචි කිරීමේ ක්‍රමය.** මේ යටතේ විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් මුදල් අය කිරීමෙන් පසු ශ්‍රමිකයන් විදෙස්ගත කිරීමට කටයුතු කිරීමේ වගකීම් විරහිත අක්‍රමවත් වැඩපිළිවෙල හා එහිදී එම ශ්‍රමිකයන් මුහුණ පා ඇති ගැටළු. සංචාරක වීසා මත විදෙස්ගත වී පසුව රැකියා අවස්ථාවක් ලබාගෙන එම වීසා බලපත්‍රය රැකියා වීසා බලපත්‍රයක් බවට පත් කර ගැනීමට අපේක්ෂා කරන පුද්ගලයන් හේතුවෙන් මෙම ගැටළුව උද්ගතවී ඇති බැවින් විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් මීට විසඳුමක් ලෙස වලංගු රැකියා ගිවිසුමක් සහිත සංචාරක වීසා බලපත්‍රයක් (90 days entry visa) ඇති ශ්‍රමිකයින් සඳහා ස්වයං ලියාපදිංචි කිරීමේ ක්‍රමය යටතේ	1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතෙහි 53(3) වගන්තියට අනුව ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා බැහැර යන සෑම ශ්‍රී ලාංකිකයෙකු විසින්ම, එසේ පිටත්ව යාමට පෙර කාර්යාංශය වෙත ලියාපදිංචි විය යුතුය. රටෙහි මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි මූලික අයිතිවාසිකම් වලට අනුව පුරවැසියෙකු තම අභිමතය පරිදි විදේශ රැකියා අවස්ථාවක් සඳහා ස්වයං මාර්ගයෙන් හෝ රැකියා නියෝජිතායතනයක් මඟින් විදේශ ගත වීමේ හැකියාව පවතී. රැකියා සඳහා විදේශ ගත වන ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් එතෙර රැකියා සඳහා පිටත්ව යාමට පෙර ස්වයං මාර්ගයෙන් හා බලපත්‍රලාභී රැකියා නියෝජිතායතන මාර්ගයෙන් කාර්යාංශයේ ලියාපදිංචිය සිදු කරනු ලබයි. ස්වයං මාර්ගයෙන් කාර්යාංශයෙහි ලියාපදිංචිය ලබා ගන්නා ශ්‍රමිකයින් විසින් රැකියා නියෝජිතායතනයක සම්බන්ධතාවයක් නොමැතිව කාර්යාංශයෙහි ලියාපදිංචිය ලබා ගැනීම සඳහා අවශ්‍ය වන සේවා ගිවිසුම/ රැකියා ගිවිසුම, වලංගු වීසා බලපත්‍රය,පුහුණුව හෝ

	විදෙස්ගත වීමට අවස්ථාවක් සලසා ඇති බව විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ග.නි. ප්‍රකාශ කළේය. කෙසේ වුවද, මෙම ක්‍රමය අවභාවිතා කිරීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය වූ බැවින් වර්තමානයේදී ස්වයං ලියාපදිංචිය අත්හිටුවා ඇති බව හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කළේය.	පළපුරුද්ද සහාථ කිරීම්,රැකියා සඳහා විදේශ ගත වන කාන්තාවක් නම් තම බාල වයස්කාර දරුවන්ගේ රැකවරණ වැඩපිළිවෙල පිළිබඳ වාර්තාව කාර්යාංශය වෙත ඉදිරිපත් කර ලියාපදිංචිය ලබා ගැනීම සිදු කර ගනු ලබයි. රැකියා නියෝජිතායතනයක් මාර්ගයෙන් රැකියාවක් සඳහා විදේශ ගත වන ශ්‍රමිකයින් රැකියා නියෝජිතායතනය මාර්ගයෙන් කාර්යාංශයේ ලියාපදිංචි කිරීම සිදු කරනු ලබයි. රැකියා සඳහා ස්වයං මාර්ගයෙන් විදේශ ගතවන ශ්‍රමිකයින් කාර්යාංශයෙහි ලියාපදිංචි කිරීම වසර 25කට වැඩි කාලයක් තිස්සේ අඛණ්ඩව සිදු කර ඇති අතර එම ලියාපදිංචි කිරීමේ කාර්යයන් කාර්යාංශයෙහි නීතිරීති වලට යටත්ව සිදු කර ඇත. ගෝලීය වශයෙන් බලපෑමට ලක් වූ කොරෝනා වසංගත තත්වය හේතුකොට ගෙන 2020 වර්ෂයෙහි සිට රැකියා සඳහා විදේශ ගත වන ශ්‍රමිකයින්ගේ ක්‍රමික අඩුවක් දක්නට ලැබුණු අතර 2020 වර්ෂයේ දී ස්වයං මාර්ගයෙන් ශ්‍රමිකයින් 35,644 ක සංඛ්‍යාවක්ද, රැකියා නියෝජිතායතන මාර්ගයෙන් ශ්‍රමිකයින් 18,058 ක සංඛ්‍යාවක්ද කාර්යාංශයෙහි ලියාපදිංචිය ලබාගෙන රැකියා සඳහා විදේශ ගතව ඇත. කොරෝනා වසංගත තත්වය හේතුකොට ගෙන ගෝලීය වශයෙන් ඇති වූ තත්වය මත ජාතික ආර්ථිකයට බලපෑ අහිතකර තත්වයන් හේතු කොට ගෙන, ලාංකික ජනතාවට ආර්ථික වශයෙන් දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදු වූ බැවින් පැවති ගෝලීය ප්‍රවනතාවයන් මත වලංගු රැකියා ගිවිසුමක් සහිතව රැකියා සඳහා විදේශ ගත වීමට වලංගු ඇතුල්වීමේ වීසා බලපත්‍රයක් (Entry Visa) ඇති ශ්‍රමිකයින් සඳහා ස්වයං ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය යටතේ කාර්යාංශයෙහි ලියාපදිංචිය ලබාගෙන රැකියා සඳහා විදේශ ගත වීමට 2021.09.23 වන දින සිට කාර්යාංශය විසින් දැඩි කොන්දේසි යටතේ අවසර ලබා දීම සිදු කරන ලදී. විශේෂයෙන්ම ගෝලීය වශයෙන් බලපෑම් එල්ල කරන ලද කොරෝනා වසංගත තත්වය තුල එක්සත් අරාබි එමීර් රාජ්‍ය වෙත සංචාරක වීසා මගින් ශ්‍රමිකයින්ට රැකියා අවස්ථා සඳහා විදේශ ගත වීමට ඉඩකඩ ලැබුණු අතර සංචාරක වීසා මගින් රැකියාවන් සඳහා විදේශ ගත වූ ශ්‍රමිකයින් හට රැකියා වීසා ලබා ගැනීමේ හැකියාව පැවතුනි.

		කෙසේ වුවද, සංචාරක වීසා මගින් රැකියා සඳහා විදේශ ගත වීමට ලබා දී ඇති අවස්ථාව අවභාවිතා කරන බවට කාර්යාංශයට නිරීක්ෂණය වූ බැවින් 2022.10.28 වන දින සිට එක්සත් අරාබි එමීර් රාජ්‍ය වෙත හා ඕමාන් රාජ්‍ය වෙත සංචාරක වීසා මගින් ගෘහස්ථ අංශයේ කාන්තා රැකියා වලට හා අඩු නිපුනතා මට්ටමක් සහිත රැකියාවන් සඳහා කාන්තාවන් ස්වයං මාර්ගයෙන් ලියාපදිංචිය ලබාගෙන විදේශ ගත වීම අත්හිටු වන ලදී. තවද, 2022.11.21 වන දින සිට එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙහි හා ඕමාන් රාජ්‍යයෙහි ගෘහස්ථ රැකියාවන් සඳහා මෙන්ම අඩු නිපුනතා මට්ටමක් සහිත රැකියාවන් සඳහා කාන්තා ශ්‍රමිකයින් ස්වයං මාර්ගයෙන් කාර්යාංශයෙහි ලියාපදිංචි කිරීම අත්හිටුවා ඇති අතර එම රැකියා අවස්ථාවන් සඳහා රැකියා නියෝජිතායතනයක් මාර්ගයෙන් විදේශ ගත වීම සඳහා ඉඩකඩ ලබා දී ඇත. මෙසේ සිදු කරනු ලබනුයේ එම රටවලට ස්වයංමාර්ගයෙන් ගෘහස්ථ රැකියා සඳහා විදේශගත වූ කාන්තාවන්ට මුහුණ පෑමට සිදුවූ සුවිශේෂී අපහසුතා සැලකිල්ලට ගෙනය. කෙසේ වෙතත් මෙම ක්‍රමවේදයේ ඇති කාර්යක්ෂමතාව සලකා බලා දැඩි නීති රීති යටතේ විදේශ රැකියා ඒජන්සි ආයතන වලට එමඟින් ලියාපදිංචිය ලබා දීමට 2023.03.20 දින අවසර ලබා දී ඇත. එමඟින් විදේශ ගත වී දින 30 ක් උපරිම 45 ක කාලයක් තුළ රැකියාව ලබාදී සේවා යෝජකයා සමඟ අත්සන් කරන ලද ගිවිසුම තානාපති කාර්යාලයට ලබා දීමට කටයුතු කර ඇත. යම් හෙයකින් දින 15 ක් ඇතුළත රැකියා ලබා දීමට අපොහොසත් වුවහොත් ඒජන්සියේ වියදමෙන් ලංකාවට අදාළ කාන්තාව ගෙන්වා ගත යුතුය.
4	**වැඩ තහනමකට ලක්ව සිටින ඕමාන් තානාපති කාර්යාල නිලධාරියා පිළිබඳ තත්වය.** මේ වන විට වැඩ තහනමකට ලක්ව සිටින ඕමාන් තානාපති කාර්යාල නිලධාරියාට එරෙහි මුදල් හා සහතික වංචා පැමිණිලි	"ගෘහ සේවය සඳහා විදේශගතව විවිධ හේතූන් මත ඕමාන් රාජ්‍යයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ආරක්ෂිත නිවස්නය වෙත පැමිණ සිටින විත්දිත කාන්තාවන් 45 දෙනා සම්බන්ධ විමර්ශනය" මැයෙන්, තැනැත්තන් වෙළඳාම, ජාවාරම් විමර්ශන හා සමුදිය

	2022 පෙබරවාරි මාසයේ සිට ලැබීම මත විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හිටපු සභාපතිවරයා විසින් ඒ පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණයක් සිදු කරන ලෙස නියෝග කර ඇත. එම පරීක්ෂණයට බාධා විය හැකි බැවින් අදාළ නිලධාරියා මෙරටට ගෙන්වා ගන්නා ලෙස විදේශ රැකියා අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කර තිබුණද ඒ සඳහා තීරණයක් ගැනීමට ප්‍රමාද වීම. **කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග** මේ සම්බන්ධයෙන් 2022.02.28 වන දින පරීක්ෂණයක් සිදු කළ ද චෝදනා තහවුරු නොවූ බව විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ග.නි. ප්‍රකාශ කළේය. තවද ඕමානයේ මෙරට තානාපතිවරයාගෙන් වාර්තාවක් කැඳවීමෙන් අනතුරුව සහ නොවැම්බර් මාසයේ 4 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලැබුණු පරීක්ෂණ වාර්තාව මත කාර්යාංශය මගින් නිලධාරියාගේ වැඩ තහනමට ලක් කළ බව ද වර්තමානයේදී විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් අභ්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර ඇති බව ද හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කළේය	අපරාධ විමර්ශන කොට්ඨාශය වෙතින් 2022.11.04 දිනැති ලිපිය මගින් වාර්තා කළ කරුණු අනුව, එහි ගෘහ සේවය සඳහා විදේශගතව ඕමාන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ආරක්ෂිත නිවස්නයට පැමිණි ශ්‍රී ලාංකික කාන්තාවකට අයුතු ලිංගික බලපෑම් කර ඇති බවට කරුණු අනාවරණය වී ඇති බැවින්, එම සිද්ධියට වගකිව යුතු යැයි එම ලිපියේ සඳහන් කරන ලද ඕමාන් තානාපති කාර්යාලයේ තෙවන ලේකම් ලෙස කටයුතු කළ ඊ. කුෂාන් මහතාගේ වැඩ තහනම් කිරීම 2022.11.11 දිනැති ලිපිය මගින් සිදු කර ඇත. වැඩ තහනමට ලක් කළ ඉහත නිලධාරී මහතා විසින් සිදු කළායැයි කියනු ලබන සිද්ධිය සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කිරීම සඳහා විමර්ශන නිලධාරී වශයෙන් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ සහකාර ලේකම් (පාලන) වන්දන මාකේල්වල මහතා 2023.02.08 දිනැති ලිපිය මගින් පත් කර ඇති අතර, ඒ මහතා විසින් මූලික විමර්ශනය අවසන් කර විමර්ශන වාර්තාව කාර්යාංශය වෙත ඉදිරිපත් කර ඇත. එකී විමර්ශන වාර්තාවේ නිර්දේශ ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතව පවතී.
5	**සංචාරක වීසා මත රැකියා සඳහා විදෙස්ගත වන ශ්‍රමිකයන් සඳහා වන රක්ෂණ යෝජනා ක්‍රමයක්,** ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි නොවී සංචාරක වීසා මත රැකියා ලබා ගැනීමේ අපේක්ෂාවෙන් විදෙස්ගත වන ශ්‍රමිකයන් හට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති	විදේශ රැකියාවක් සඳහා කාර්යාංශ ලියාපදිංචිය ලබා ගෙන විදෙස්ගත වන ශ්‍රමිකයින්හට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හරහා ක්‍රියාත්මක රක්ෂණාවරණය හිමි වේ. විදේශ රැකියාවක් නොවන කටයුත්තකට සංචාරක වීසාමත විදෙස්ගතවන ශ්‍රමිකයින් සඳහා රක්ෂණ ආවරණ පහසුකම් සලසාදීම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විෂය පථයට අදාල කරුණක් නොවේ.

	කාර්යාංශයේ ලියාපදිංචි වන විගමණික ශ්‍රමිකයන් සඳහා වන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හරහා ක්‍රියාත්මක වන රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ හදිසි අවස්ථාවකදි රක්ෂණ හිමිකම් ඉල්ලුම් කිරීමට ඇති හැකියාව. **කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග** මෙම රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ සංචාරක වීසා මත රැකියා සඳහා විදෙස්ගත වන විගමණික ශ්‍රමිකයන් හට හදිසි අවස්ථාවකදි රක්ෂණ හිමිකම් ඉල්ලුම් කිරීමට නොහැකි බව කාරක සභාව ඉදිරියේ අනාවරණය විය. කෙසේ වුවද, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පවතින Readmission Case Management System (RCMS) හරහා හදිසි අවස්ථාවන්හි දී ශ්‍රී ලාංකික ගමන් බලපත්‍රයක් හිමි ශ්‍රමිකයින් නැවත ගෙන්වා ගැනීමේ කඩිනම් ක්‍රමවේදයක් ඇති බව මෙහිදි අනාවරණය විය. **නිර්දේශ/ නියෝග** එබැවින්, සංචාරක වීසාමත රැකියා ලබා ගැනීමේ අපේක්ෂාවෙන් විදේශගත වන ශ්‍රමිකයන්ද ආවරණය වන පරිදි සුදුසු රක්ෂණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය සමග සලකා බලා ඒ පිළිබඳ කාරක සභාවට මසක් තුළ වාර්තාවක් ලබා දෙන ලෙස කාරක සභාව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ග.නි.වෙත නියෝග කළේය. **මේ පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ලබා දී නැත.**	

6	**කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ බඳවා ගත් සංවර්ධන නිලධාරීන් 951 දෙනාගෙන් අපේක්ෂිත අරමුණු ඉටු නොවීම.** **කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග** මෙම නිලධාරීන් ස්ථානගත කිරීම හා ඔවුන් විසින් දැනට සිදු කරනු ලබන කාර්යභාරය තුලින් විදේශ රැකියා ප්‍රවර්ධනයට සම්බන්ධ අපේක්ෂිත අරමුණු සපුරාගැනීමට නොහැකි වීම, මෙම නිලධාරීන් විසින් සිදු කරන අවිනය ක්‍රියා හා ඒ පිළිබඳ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ පසු විපරම් කාර්යය අසතුටුදායක වීම පිළිබඳ කාරක සභාව සිය අප්‍රසාදය පළ කළේය.	කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ විදේශ රැකියා ප්‍රවර්ධනය හා විගමණික පවුල්වල සුභ සාධනය සඳහා මේ වන විට සංවර්ධන නිලධාරීන් 936 දිවයිනේ දිස්ත්‍රික්ක 25 තුලම දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර ඇත. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරන සංවර්ධන නිලධාරීන් සඳහා පවරා ඇති රාජකාරී කටයුතු ඔවුන් විසින් පැහැර හැරීම් සහ ඔවුන් විසින් විෂමාචාරයන් සිදුකිරීම් සම්බන්ධයෙන් අමාත්‍යාංශය මගින් අවධානය යොමු කොට පහත දක්වා ඇති පරිදි සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනීමට හා පසුවිපරම් කිරීමට කටයුතු කර ඇත. විෂමාචාරයන් සිදුකිරීම සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ආරම්භ කර එම කටයුතු සිදු වෙමින් පවතින සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව 30කි. මේ වන විට චෝදනා පත්‍ර නිකුත් කර විධිමත් විනය ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂිත සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව 07 ක් වන අතර තවත් සංවර්ධන නිලධාරීන් 07 දෙනෙකු සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණ කටයුතු සිදුවෙමින් පවතී. තනතුර අතහැර යාමේ නිවේදන නිකුත් කර ඇති සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව 14ක් වන අතර එක් සංවර්ධන නිලධාරියෙක් සේවයෙන් පහකර ඇත. සංවර්ධන නිලධාරීන් 10 දෙනෙක් සඳහා විනය නියෝග නිකුත් කොට විනය ක්‍රියාමාර්ග අවසන් කර ඇත. එසේම සංවර්ධන නිලධාරීන් 07 දෙනෙකුට අවවාද ලිපි නිකුත් කොට එමගින් විනය කටයුතු අවසන් කර ඇත. මෙම නිලධාරීන් වෙත පවරා ඇති රාජකාරී කටයුතු පිළිබඳ විස්තරාත්මක තොරතුරු පූර්ව වාර්තාව මගින් ලබා දී ඇත. විදේශ රැකියා ප්‍රවර්ධනය සඳහා සංවර්ධන නිලධාරීන් විසින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ දී පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී. • ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙතින් ලබාගන්නා රැකියා අවස්ථා සම්බන්ධ තොරතුරු ප්‍රාදේශීය මට්ටමෙන් දැනුවත් කිරීම. • විදේශ රැකියා අපේක්ෂිතයින් හඳුනාගැනීම සහ පුහුණුව අවශ්‍ය පිරිස් පුහුණු ආයතන

		වෙත යොමුකිරීම. • සුරක්ෂිත සංක්‍රමණය , මිනිස් වෙළඳාමේ ගොදුරක් නොවීම, මූල්‍ය සාක්ෂරතාවය වැනි ක්ෂේත්‍රයට අදාල කරුණු සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීම. • දරුවන්ගේ රැකවරණ වැඩපිළිවෙල පිළිබඳ වාර්තා නිකුත් කිරීම සහ ලබාදුන් රැකවරණ වැඩපිළිවෙල සම්බන්ධයෙන් නිරන්තර අධීක්ෂණය. • විගමනික ශ්‍රමික පවුල්වල ආරක්ෂාව සහ සුබසාධනය වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මකකිරීම. • විදේශ රැකියා සඳහා යොමුවීමට අපේක්ෂිත පිරිස, විදේශ රැකියා ගතවූවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් , නැවත පැමිණි විගමනික ශ්‍රමිකයින් සම්බන්ධ කර ගනිමින් විගමනික ශ්‍රමික සංගම් පිහිටුවීම. විගමනික ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය , ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා සම්බන්ධ වෙමින් ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩසටහන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායි මට්ටමින් සිදු කිරීම වෙනුවෙන් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සංවර්ධන නිළධාරින්ගේ රාජකාරී කටයුතු අධීක්ෂණය සහ ප්‍රගතිය සමාලෝචනය වෙනුවෙන් ගරු විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරින්ගේ සහ අදාල දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සහභාගිත්වයෙන් පළාත් මට්ටමින් විශේෂ ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වනු ලබයි. මේ යටතේ පළාත් 06 කට අදාල වැඩසටහන් මේ වනවිට අවසන් කර ඇති අතර, නැඟෙනහිර පළාත් වැඩසටහන ඔක්තෝබර් මස 10 දින පවත්වන ලදි.

		• මෙයට සමගාමීව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සංවර්ධන නිළධාරින්ගේ රාජකාරී කටයුතු අධීක්ෂණය සහ ප්‍රගතිය සමාලෝචනය වෙනුවෙන් එක් එක් පළාත්/ දිස්ත්‍රික් හාරව අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරින් 2023.04.26 දින සිට පත් කර ඇති අතර, එම නිලධාරින් ද තමා වෙත වගකීම් පැවරී ඇති දිස්ත්‍රික්කයන් හි නිලධාරින් සමඟ මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සම්බන්ධ වෙමින් ප්‍රගතිය සමාලෝචනය මෙන්ම නිලධාරින්ගේ ගැටළු, අදහස් ,යෝජනා ලබාගැනීම ද සිදුකරමින් පවතී. • එසේම මෙලෙස අමාත්‍යාංශය යටතේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සංවර්ධන නිලධාරින් විසින් විදේශ රැකියා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සිදුකරන රාජකාරී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා සම්බන්ධිත කාර්යයන් බැවින් මනා සම්බන්ධීකරණයකින් යුතුව සිදුකිරීම වෙනුවෙන් මෙම නිලධාරින් ඉදිරියේ දී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අනුයුක්ත කිරීම සම්බන්ධයෙන් ද පියවර ගනිමින් පවතී.
7	**2018 සිට 2022 ඔක්තෝම්බර් 31 දක්වා රටවල් 15ක තානාපති කාර්යාල අනුමැතිය සහිතව කාර්යාංශයේ ලියාපදිංචි කරන ලද රැකියා පුරප්පාඩු සංඛ්‍යාව 1,852,680ක් වුවත් ඊට අදාළව ශ්‍රමිකයන් 243,833ක් පමණක් අදාළ රැකියා සඳහා පිටත්ව ගොස් තිබීම.** **කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග** විදේශ රටවල පවතින නන්‍ය පුරප්පාඩු සංඛ්‍යාව වෙනුවට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවක් ලියාපදිංචි කිරීම මීට හේතු වී ඇති බව කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි.ප්‍රකාශ කළේය.	2018 වර්ෂයේ සිට 2022 ඔක්තෝම්බර් 31 දක්වා වූ කාල සීමාව තුළ ලැබී ඇති රැකියා පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවධානය යොමු කිරීමේදී එසේ ලැබී ඇති රැකියා පුරප්පාඩු වලින් බහුතරයක් ගෘහස්ථ අංශයේ කාන්තා රැකියා (ගෘහ සේවිකා) සඳහා ලැබී ඇති පුරප්පාඩු බව නිරීක්ෂණය වේ . ගෘහස්ථ අංශයේ කාන්තා රැකියා සඳහා වැඩි පුරප්පාඩු සංඛ්‍යාවක් ලැබුනද, දේශීය වශයෙන් එම පුරප්පාඩු සංඛ්‍යාව සඳහා කාන්තා ශ්‍රමිකයන් යොමු කිරීමට දේශීය රැකියා වෙළඳපොළ තුලින් සොයා ගැනීමට නොහැකි වීම තුළ මෙම තත්වය උද්ගතවීමට බලපෑ එක් හේතුවක් ලෙස පෙන්වා දිය හැක.එසේම, පහත සඳහන් හේතූන් ද මෙම තත්වය ඇති වීමට බලපා ඇති බව නිරීක්ෂණය වේ

		රැකියා ඇණවුමක සඳහන් කෙරෙන රැකියා පුරප්පාඩු සංඛ්‍යාව වසර දෙකක් (2) තුළ ලැබෙයැයි අපේක්ෂිත රැකියා අවස්ථා මිස සත්‍යවශයෙන් පවතින රැකියා අවස්ථා නොවේ. • එතෙර සමාගමකින් හෝ එතෙර රැකියා නියෝජිතායතනයකින් රැකියා ඇණවුමක් රටවල් කිහිපයක් සඳහා ලබාදෙනු ලබන අතර එකම රටකින් පමණක් ශ්‍රමිකයින් බඳවා ගැනීම සිදු කරනු නොලබයි. • එසේම, එතෙර සමාගමකින් හෝ එතෙර රැකියා නියෝජිතායතනයක් විසින් එකම රැකියා ඇණවුම මෙරට රැකියා නියෝජිතායතන කිහිපයකට ලබා දෙනු ලබන අවස්ථාවන් නිරීක්ෂණය වේ. • එතෙර සමාගමක් හෝ එතෙර රැකියා නියෝජිතායතනයක් වැඩි තෝරා ගැනීමක් කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන රැකියා ඇබෑර්තු සංඛ්‍යාව වැඩි වශයෙන් හුවා දක්වමින් රැකියා ඇණවුම් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවන් නිරීක්ෂණය වේ. කාර්යාංශය වෙත මෙම තත්වයන් නිරීක්ෂණය වූ බැවින් එම තත්වයන් පාලනය කිරීමට රැකියා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් වන රැකියා ඇණවුමක පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙහි එකතුව 100 ට වැඩිවන අවස්ථාවන් හිදී එම රැකියා ඇණවුමෙහි සඳහන් කර ඇති එක් එක් රැකියා කාණ්ඩයෙහි පුරප්පාඩු සංඛ්‍යාවෙන් 25% ක ප්‍රමාණයක් පළමු අදියර යටතේ අනුමත කිරීමට 2022.09.08 වන දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියා කිරීමට කාර්යාංශය තීරණය කර ඇත. පළමු අදියර යටතේ අනුමත කරනු ලබන රැකියා පුරප්පාඩු සංඛ්‍යාව සඳහා ශ්‍රමිකයින් යොමු කළ පසුව අදියර වශයෙන් 25% බැගින් එක් එක් රැකියා කාණ්ඩය සඳහා රැකියා ඇබෑර්තු අනුමත කිරීම කාර්යාංශය විසින් සිදු කරනු ලබයි. මෙම ක්‍රියාවලිය තුළින් අනවශ්‍ය ලෙස පුරප්පාඩු සංඛ්‍යාවන් හුවා දැක්වීම මග හරවා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ගයන් ගෙන ඇත.

8	ජපානයේ SSW Programme මේ සඳහා 2019 වර්ෂයේදී ශ්‍රමිකයින් 14,302 ක් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි කර ගෙන තිබුණද එම රැකියා සඳහා කිසිවකු යොමු කොට නොතිබීම. **කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග** මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය, වෘත්තීය පුහුණු අධිකාරිය හා සමෘද්ධි ආදී අංශයන් සම්බන්ධීකරණයෙන් ශ්‍රී ලංකාවට ලබා දී ඇති කෘෂිකර්ම, ආහාර සේවා හා හෙද යන අංශවලට අදාළව පුහුණු අවස්ථා ලබාදීමට කටයුතු කරමින් පවතින බව ප්‍ර.ග.නි.ප්‍රකාශ කළේය.	SSW වැඩසටහන යටතේ ශ්‍රී ලංකාව වෙත මේ වන විට ක්ෂේත්‍ර තුනකින් එනම්, ආහාර පිළිගැන්වීම, හෙද සත්කාරක සේවා සහ කෘෂිකර්මාන්තය යටතේ ආහාර පිළිගැන්වීම හා හෙද සත්කාරක සේවා යන ක්ෂේත්‍ර ඉලක්ක කර ගනිමින් පුහුණු පාඨමාලා (අනුමත ජපන් විභාග වන JET/ JLPT - N4 හා කුසලතා විභාග) වෘත්තීය පුහුණු අධිකාරිය විසින් මේ වන විට ක්‍රියාත්මක කරමින් පවති. SSW වැඩසටහන යටතේ අනුමත රැකියා අවස්ථා සඳහා භාෂා හා කුසලතා පුහුණුව, රාජ්‍ය හා පෞද්ගලික දෙ අංශයේම පුහුණු ආයතන මගින් මේ වන විට ක්‍රියාත්මකව සිදු කරනු ලබයි. ජපන් භාෂා පාඨමාලා පවත්වා ගෙන යාම සඳහා කාර්යාංශය ආයතන 14 ක් සමග ගිවිසුම් අත්සන් කර ඇත.

මනුෂ නානායක්කාර
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
7 වන මහල, "මෙහෙවර පියෙස"
නාරහේන්පිට කොළඹ 05

මනුෂ නානායක්කාර, පා.ම.
කම්කරු හා විදේශ රැකියා ගරු අමාත්‍ය,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය.

ඇමුණුම -01

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு

Ministry of Labour and Foreign Employment

නයවන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 05, ශ්‍රී ලංකාව.

6 ஆவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 05, இலங்கை.

6th Floor, " Mehewara Piyesa", Narahenpita, Colombo 05, Sri Lanka.

මගේ අංකය / எனது இல / My No.	MFE/DEV/FBR1/11/2022	ඔබේ අංකය / உமது இல / Your No.	දිනය / திகதி / Date: 2023.03.01

ලේකම්
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව

විදෙස් රැකියා වෙළඳපොළ වෙත ගුණාත්මක භාවයෙන් සහ නිපුණතාවයෙන් යුතු ශ්‍රම බලකායක් සැපයීම අරමුණු කරගනිමින් සකස්කරන ලද කඩිනම් ක්‍රියාකාරී සැලැස්ම

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2022.11.22 දින පාර්ලිමේන්තුවේදී පැවති රැස්වීමේ දී විදේශ රැකියා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලබා දෙන ලද නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශය මූලිකත්වයෙන් පහත සඳහන් අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් සමන්විත කමිටුවක් පත්කරන ලදි.

1. කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශය (කමිටුවේ සභාපති)
2. විදේශ කටයුතු අමාත්‍යාංශය
3. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
4. අධ්‍යාපන අමාත්‍යාංශය
5. සෞඛ්‍ය අමාත්‍යාංශය

ඒ අනුව, එම අමාත්‍යාංශ නියෝජනය කරමින් අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් නම් කරන ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් 2022.11.30, 2022.12.20, 2023.01.17 හා 2023.01.27 යන දිනයන්හිදී රැස්වූ කමිටුව විසින්, තරඟකාරී විදෙස් රැකියා වෙළඳපොළ වෙත ගුණාත්මක භාවයෙන් සහ නිපුණතාවයෙන් යුතු විදෙස් ශ්‍රම බලකායක් සැපයීම අරමුණු කර ගනිමින් සකස්කරන ලද කඩිනම් ක්‍රියාකාරී සැලැස්ම 2023.01.18 දින රාජ්‍ය ගිණුම්කාරක සභාවේ උප කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

රාජ්‍ය ගිණුම්කාරක සභාවේ උප කමිටුව විසින් අදාල ක්‍රියාකාරී සැලැස්ම අධ්‍යනය කිරීමෙන් අනතුරුව 2023 වර්ෂයේ ඉදිරි මාස 06 ඇතුලත ඉටුකිරීමට අපේක්ෂිත කාර්යයන් විශේෂිතව දක්වමින් විස්තරාත්මක ක්‍රියාකාරකම් සැලැස්මක් සමඟ ඉදිරිපත් කරන ලෙස නියෝග කරන ලදී.

ඇමුණුම - 01

කාර්යාලය/ தொலைபேசி/Phone : +94 112 581941 ෆැක්ස්/தொலைநகல்/Fax : +94 112 582938, 94 112 368165

ඒ අනුව, අන්තර් අමාත්‍යාංශ කමිටුව 2023.01.27 හා 2023.03.01 දිනයන්හිදී රැස්වූ අතර එහිදී සකස් කරන ලද විස්තරාත්මක ක්‍රියාකාරකම් ඇතුලත් ක්‍රියාකාරී සැලැස්ම රාජ්‍ය ගිණුම්කාරක සභාවේ අවධානය සඳහා යොමුකිරීමට මේ සමඟ කාරුණික ව ඉදිරිපත් කරමු.

ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
සහ පළාත් පාලන අමාත්‍යාංශය

ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය

ලේකම්
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

ලේකම්
විදේශ කටයුතු අමාත්‍යාංශය

Action Plan for Ensuring the Qualitative Improvement in the Foreign Employment Sector

Objective: Enable the Sri Lankan Labour Force to Access Labour Market Opportunities and Facilitate better Socio - Economic Gains

S/N	Strategy	Activity	Sub Activity	KPI	Responsible Agency /Agencies	Time Frame											
						2022	2023				2024				2025			
						Q4	Q1	Q2	Q3	Q4	Q1	Q2	Q3	Q4	Q1	Q2	Q3	Q4
1	Increase market penetration for Sri Lankan migrant workers through promotional interventions	1.1 Carrying out a study or market analysis on foreign job market and identity current and future job opportunities with required qualifications.		No.of new markets identified/job opportunities	MoL & FE/ILO													
		1.2 Conduct situational analysis of the existing local labour market and identify factors that affect/ impact aspirant migrant workers		No.of factors identified/ Issues and trends of local labour markets are identified	MoL&FE (By an expert panel)													
		1.3 Establish a task force for bridging supply and demand of labour movements		Task force is established	MoL& FE/ MoFA/ SLBFE/TVEC & TVET Providers													
			1.3.1 Establish a task force to prepare employment ready job bank, operationalize the job bank and review the progress	Employment ready job bank is operationalized	MoL& FE/ Task Force/ MoPUBAD													
			1.3.2 Develop intergration platform and Decision Suport System (DSS)		MoPUBAD/ MoL&FE													
		1.4 Implement promotional activities in host countries in order to create demand for skill labour force available in Sri Lanka and find foreign job opportunities			MoL&FE/SLBFE MoFA/TVEC/ TVET													
			1.4.1 Initiate the process for recruiting Labour Promotion Officers locally (Countries of Destination) i.e Japan Saudi Arabia Qatar Kuwait Oman Singapore	No. of Officers recruited	MoL&FE/ SLBFE/ MoFA													
			1.4.2 Conduct promotional activities though locally recruited officers	No.of promotional activities conducted/ No.of job opportunities identified	MoL&FE/ SLBFE/MoFA													

Strategy	Activity	Sub Activity	KPI	Responsible Agency /Agencies	Time Frame											
					2022	2023				2024				2025			
					Q4	Q1	Q2	Q3	Q4	Q1	Q2	Q3	Q4	Q1	Q2	Q3	Q4
		1.4.3 Expedite the process of recruiting health sector workers (nurses) specifically for countries like Oman and Singapore	No. of Officers recruited	MoL&FE/ SLBFE/ MoH/ MoFA													
		1.4.4 Develop video clips highlighting skills of Sri Lankan work force	No. of multi media promotional materials produced	MoL&FE/ SLBFE/ TVEC													
	1.5 Develop and disseminate guiding manual/ e- book which emphasize workers' rights, responsibilities, obligations and the benefits that they are eligible (throughout job contracts).		Guiding manual/ e- book developed and disseminated	MoL&FE/ SLBFE/ MoFA													
		1.5.1 Update the existing guidelines for several critical jobs and make available as e-book	e-book is available	MoL&FE/ SLBFE													
Strengthen sectoral coordination and invest in skills development to meet global and local labour market demands	2.1 Establish a coordination mechanism to create skillful labour force		Established coordination mechanism	MoL&FE													
		2.1.1 Initiate the process of establishing permanent inter Ministerial coordinating committeee comprised of MoLFE, MoFA, MoE, MoH, MPubAd	Process initiated	MoL&FE													
	2.2 Enter into skills partnership with countries of destinations.		No. of partnerships establised	MoE/ MoFA/TVEC other Goverment and Privete sector institations													
	2.3 Improve pre-departure training and orientation to enhance competencies/ soft skills enabling smooth job placement.		No. of trainees passed	MoL&FE/ SLBFE/ MoE/TVEC													
	2.4 Promote enrolment for training courses targeting highly demanded Employment opportunities		No.of trainees enrolled	Training providers/ MoE/ TVEC/ MoL&FE/ SLBFE/ MoFA													

S/N	Strategy	Activity	Sub Activity	KPI	Responsible Agency /Agencies	Time Frame											
						2022	2023				2024				2025		
						Q4	Q1	Q2	Q3	Q4	Q1	Q2	Q3	Q4	Q1	Q2	Q3	Q4
